Rev. A. Atdlasena.

# A GLOSSARY

TO

# THUPAWANSA

BY

**A. S. PERERA,**

**KADAWATA.**

## සිංහල ථූපවංශ

# ග්‍රන්ථිපද විස්තරාර්ථ වර්ණනා.

කඩවත

ඒ. එස්. පෙරේරා මහතා

විසින් ලියන ලදී.

ජේ. ඩී. ප්‍රනාන්දු

විසින්

කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයේ මුද්‍රිතයි.

1923.

Price cts. 50. 25 [7] 23. මිල ශත 50.

# සංඥාපනය.

මේ වනාහි අපගේ ග්‍රන්ථිපද විවරණ පඞ්ක්තියෙහි දස නවවන ග්‍රන්ථයයි. ථූපවංස නම්වූ ධර්‍මග්‍රන්ථය අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගුරුවරුන්ට තුන්වනපෙළ සහතික පත්‍රදීමේ විභාගයට සූදානම් වන්නන් සඳහා නියමකරතිබේ. ගැඹුරු වචන රාශියක් මෙහි දක්නා ලැබෙන හෙයින් ග්‍රන්ථි පද විවරණයක් ලියා ප්‍රසිද්ධකරනමෙන් පාඨශාලාචාර්‍ය්‍ය මහතුන් කිහිප දෙනෙකුන් හා ආධුනිකයන් කිහිපදෙනෙකු විසින් අපෙන් අයැද සිටි හෙයින් මේ ග්‍රන්ථය අප විසින් ලියනලදී. මෙහි යොදන ලද ග්‍රන්ථිපද සියල්ලටම යථාර්‍ථයෙන් විවරණයක් ලිවීමෙහිද අක්ෂර වින්‍යාසාදිය හරි ආකාරයෙන් යෙදීමෙහිද මෙකල මුද්‍රිතව පවත්නා පොත් දෙකටම සාධාරණ වන පරිද්දෙන් පිටු පිළිවෙලින් සකස් කිරීමෙහිද පරිශ්‍රම ධැරිමු. * එසේ වුවත් මේ කෘතිය දෝෂ ස්ථානයන්ගෙන් විමුක්තියයි ප්‍රකාශ කිරීමෙහි අපි මැලිවෙමු. එහෙයින් මෙහි යම් වජ්ජස්ථානයක් දෝෂාංශුවක් දුටහොත් උගත් මහත්මෝ සමාධිය භජනය කිරීමෙන් එය අපවෙත් දන්වත් නම් මැනවයි අයැද සිටිමු. මෙය මුද්‍රණය කිරීමෙහිදී සිදුවූ දෝෂ ස්ථාන කීපයක් සංශොධනය කොට ශුද්ධිපත්‍රයක්ද යෙදීමු. උපග්‍රන්ථයක් යෙදීමට අදහස්කළ නමුත් මුද්‍රණය කිරීමෙහි ප්‍රමාදයක් නිසා එය ඉවත්කරන්ට සිදුවූ බවද මතක්කරමු.

තවද මේ සංස්කරණය සතුටින් භාරගෙන මුද්‍රණය කරවනලද කොළඹ ජේ. ඞී. ප්‍රනාන්දු මහතුන් වෙත අපගේ කෘතඥතාව මෙසින් මතක්කර සිටිමු.

**A. S. P.**

වර්‍ෂ 1923 ක්‍රි.ව. මාර්තු මස
7 වෙනි දින කඩවතදීය.

---

* වරහන් වලින් යොදා තිබෙන්නේ ඞී. බී. විජයශෙකර මහතා විසින් සංශොධිත ග්‍රන්ථයේ පිටුවල අංකයන් බව සැලකිය යුතුයි.

Rev A Atulasena

# සිංහල ථූපවංස
# ග්‍රන්ථිපද විස්තරාර්ථ වර්ණනා.

## සාමාන්‍ය සංලක්ෂණය.

“සංඥං නිමිත්තං කත්තාරම් පරිමාණම් ප්‍රයොජනම්
ප්‍රාගුක්ත්වා සර්වතන්ත්‍රාණම් පශ්චාද්වක්තානුවර්ණයෙත්.”

යනු හෙයින් සංඥාදිහු කවරහයත්?

1 සංඥාව { සාමාන්‍ය-ධර්ම ග්‍රන්ථයක්.
විශෙෂ-ථූපවංසය.

2 නිමිත්ත { බාහ්‍ය-පෙළබස්හි අව්‍යක්ත ජනයා.
අභ්‍යන්තර-මහකුශල ප්‍රාර්ථනාව හා නිවන්දැකීම.

3 කර්තෘහු —සකල විද්‍යාචක්‍රවර්ත්ති උපාධිනාමධාරි පරාක්‍රම පණ්ඩිතොත්තමයාණෝ *

4 ප්‍රමාණය—සමතිසක් පමණ කථායි.

5 ප්‍රයොජනය { බාහ්‍ය-ධාතුබෙදිම, ධාතුනිධානය, බෞද්ධධර්ම ප්‍රතිෂ්ඨාපණය, රත්නමාලි ආදි චෛත්‍ය විස්තරාදිය, දුටුගැමුණු රජයන්ගේ හා දශ මහ යොධයන්ගේ ජීවන චරිත කථා දැනීමාදිය.

අභ්‍යන්තර-බෞද්ධසමයානු විෂයෙහිවූ ස්වර්ග මොක්ෂ සම්පත්තීන් කෙරෙහි කරන ප්‍රාර්ථනාව. මේ හැර මේ ග්‍රන්ථය රචනාකරන සමයෙහි ලක්දිව පැවති භාෂාරීතිය හා වක්‍යරචනාදිය දැනීමට මෙම ග්‍රන්ථය ආධාරවේ.

6 කාලය—මතභෙදයි, සාමාන්‍ය කල්පනාව 13 වන වර්ෂයෙහිවූ දඹදෙණි පරාක්‍රමබාහු රජාණන්ගේ සමයවේ. † මේ පරාක්‍රමබාහු නරෙන්ද්‍රයානම් කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු මහාරජාණෝයි.

---

* සිංහල ථූපවංසයේ කර්තෘහු සකල විද්‍යා චක්‍රවර්ති පණ්ඩිත පරාක්‍රම විජය බාහු රජොත්තමයාණෝයයි කිසි පණ්ඩිත කෙනෙක් සලකත්.

† කලිකාල යනු යුධයෙහි යමරජු හෙවත් මාරයා යන අර්ථයි. නොහොත් පව්හරන්නා යනුයි. මේ රජයාගේ යුධ දක්ෂතාව නිසා හෝ ධාර්මිකතාව නිසා හෝ කලිකාල යන නාමයද, අලඞ්කාර ශාස්ත්‍ර සිඃල්ලම මනාවදත් හෙයින් සාහිත්‍ය සර්වඥ යන නාමයද ව්‍යවහාර කරන ලද බැව් සිතීමට කරුණු පැනේ.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



කිසි පණ්ඩිත කෙනෙක් මේ ග්‍රන්ථය 12 වන ශත වර්ෂයෙහිදී කරනලද්දේයයි කියත්. එසේ කීමට හේතුව මෙහි කර්තෘහු යථොක්ත විජයබාහු රජ යාණන්යයි සිතීමයි. 13 වන ශත වශයෙහි මේ කරන ලදයයි සිතීමට ප්‍රධාන හේතුවවූයේ යථොක්ත දඹදෙණි පරාක්‍රමබාහු රජුකල විසූ ත්‍රිපිටකාචාර්ය්‍ය භදන්ත වාචිස්සර මහාථෙරපාදයන් විසින් කරනලද පාලිභාෂාමය ථූපවංසය සිංහලට නඟන ලද්දේය යන හැඟීමයි.

7 **මූලාශ්‍රය**—චතුර්විංශත් බුද්ධවිවරණයෙන් පටන්ගෙන ථූපවර්ණනා, ධාතුවර්ණනා, ධාතුබෙදීම, ධර්මාශොක, දෙවානම්පියතිස්ස යන රජදරුවන්ගේ සම්බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපනය, දුටුගැමුණු, එළාර යන රජුන්ගේ යුද්ධාදිය, දුටුගැමුණු රජයාගේ හා දශමහායොධයන්ගේ චරිත කථාදිය විස්තර කර රත්නමාලි චෛත්‍යය වර්ණනා කිරීමයි.

8 **නාමාර්ථය**—ථූපවංස යනු මාගධ භාෂාමය සමාස පදයෙකි. සංස්කෘත භාෂානුගතව ස්තූපවංශ වියයුතුයි. චෛත්‍යයන්නෙන් සෑ යනු තද්භව වේ. රත්නමාලි යන්නෙන් රුවන්මැලි කියාද, රත්නවාලුකා යන්නෙන් රුවන්වැලි කියාද, තද්භව වේ.* රුවන්මැලි සෑය රුවන්වැලිසෑය යන නාම දෙකම මේ නයින් ශිෂ්ටව්‍යවහාරයෙහි ගැණේ.

* පාලිපොත්වල රතනමාලික රතනවාලුක යන නාම පෙනේ.

## ථූපවංස ග්‍රන්ථිපද

# විස්තාරාර්ථ වර්ණනා.

### 1. වන පිට.

අනන්තවූ=(න+අන්ත) කෙළවරක් නැත්තාවූ, සීමාරහිතවූ, අප්‍රමාණවූ.

කරුණාවෙන්=දයාවෙන්, දුකට පැමිණි සත්ත්වයන් කෙරෙහි පවත්නා දයාවෙන්.

ෂඩ්අසාධාරණඥාන=අනිකාකුහට සාධාරණ නොවන නුවණ (සයක්) එනම්-ඉන්ද්‍රියපරෝපරියත්තඥානය, ආසයානුසයඤාණය, යමකපාටිහීරඤාණය, මහාකරුණාසමාපත්ති ඤාණය, සබ්බඤ්ඤුත ඤාණය, අනාවරණ ඥානය, යන සයයි.

චතුර්වෛශාරද්‍යඥානය=සතර ආකාර විසාරදඥානය, එනම්-බුදුන් "සම්‍යක් සම්බුද්ධයෙමි"යි කීකල තා විසින් අනභිසම්බුද්ධයහයි කියන්ට නිසි දෙව්මිනිස් බඹ ආදී කෙනෙක් ලොකයේ නොද ඇති(බව) "ක්ෂීණාශ්‍රවයෙමි" යි කීකල නැති මෙතෙක් ආශ්‍රවයෝ තා විසින් අපරික්ෂණයහයි කියන්ට කිසිකෙනෙක් ලොකයෙහි නොද ඇති (බව) මේ ධර්මයෝ ස්වර්ග මොක්ෂයට අන්තරාය කරහයි කීකල නැති මේ ධර්මයෝ අන්තරායකර නොවෙයි කියන්නට කිසි කෙනෙක් ලොකයෙහි නොද ඇති (බව) මේ ධර්මයෝ නෛර්‍යාණිකයයි කීකල නැති මේ ධර්මයෝ අනෛර්‍යාණිකයහයි කියන්නට කිසිකෙනෙක් ලෝකයෙහි නොද ඇති (බව) යන සතර ස්ථානයෙහි තමන්ගේ විසාරද භාව ප්‍රත්‍යවෙක්ෂකරන බුදුන්ට උපන් සෞමනස්‍යඥානය, ප්‍රදීපිකාව බලා විස්තර දතයුතු.

අෂ්ටපර්ෂද්=ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ, චාතුර්මහාරාජික, තව්තිසා, මාර, බ්‍රහ්ම යන අටපිරිස්.

අකම්ප්‍යඥානය=කම්පාකල නොහැකි නුවණ, ස්ථිරබුද්ධිය.

ඝෘණවත්වූ=ඝෘනය ඇතිවූ, නුවණින් යුත්වූ.

විශාරදවූ=අධිකවූ, සමර්ථවූ.

වාදපථයෙක්=කථාමාර්ගයෙන්, වාදයට පැමිණෙන්නෙක්.

භුවනත්‍රයට=ලොකතුනට; ස්වර්ග, මර්ත්‍ය, පාතාල නොහොත් රූප, අරූප, කාම, යන තිලොවට.

විනයනය=හික්මීමට පත්කිරිම.

සහසිකවූ=කොපවන්නාවූ, කිපෙන්නාවූ.

අඞ්ගුලිමාල=ඇඟිලිමාලාවක් මෙන් එල්ලාගත් සොරෙක්.

අපරිමිතවූ=පරිමිතනූවූ, මෙපමණයයි ප්‍රමාණයක් නැතිවූ.

අතුල්‍යවූ=තුල්‍යනූවූ, සමානනූවූ. [කිවූ.

අවාච්‍යවූ=වචනයෙන් කියනොහැකිවූ, වර්ණනාකළ නොහැ

තිඹක්=ලාස්සතරක්.

නිර්වාණකළ=තැන්පත්කළ.

රත්නයෙන්=මැණික් වලින්, රත්නනවවර්ගයෙනු පමණකොට දක්වා තිබේ-ඔව්හු නම්- රන්, රිදී, මුතු, මැණික්, වජ්‍ර (දියමන්ති) ගෝමේද, වෛරළුමිණි, පබළු, නීල, පුෂ්පරාග, පච්ච යනුවෙත්.

උජ්ජ්වලිතවූ=(උ+ජ්වලිතවූ) දිලිසෙන, බබළන, බැබළීම ඇති. [අළුයි.

රත්නමාලී=රුවන්මැලි, රත්නමාලායෙන් බඳනාලද යනු

සාවධානව=වික්ෂිප්තනොවී, කලබල නැතිව.

අවික්ෂිප්තව=(අ+වික්ෂිප්තව) සිතනොයෙක් අත්ට නොයොදවා එකම කල්පනාවක යොදා.

දසාව=දෙස, පැත්ත.

සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂය=(සාර+අසඞ්ඛ්‍ය+කල්ප+ලක්ෂය) අසංඛ්‍ය කල්ප ලක්ෂසතරක්, කල්පයෝ වනාහි අන්තඃකල්පය, අසඞ්ඛ්‍යකල්පය, මහාකල්පයයි ත්‍රිවිධවෙත් අන්තඃකල්පයක් වනාහි මනුෂ්‍යායුෂ දශවර්ෂයේ පටන් ආරම්භව ක්‍රමයෙන් අසඞ්ඛ්‍යායුෂය දක්වා නැගීගොස් නැවත ක්‍රමයෙන් පහතබැස දශවර්ෂය දක්වා අඩුවීමට ගතවන කාලයයි. අන්තඃකල්ප විස්සක් අසඞ්ඛ්‍යකල්පයකි. මෙහි වර්ෂප්‍රමාණයෝ ඒකය දශය, ශතය, සහස්‍රය යනාදීන් සඞ්ඛ්‍යා ක්‍රම

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



ඉක්මවා සිටින හෙයින් අසඞ්ඛ්‍යකල්ප නම් වේ. සංවර්තය, සංවර්තස්ථායිය, විවර්තය, විවර්තස්ථායියයන සතර අසඞ්ඛ්‍යකල්පයෙක් එක්වූකල්හි මහාකල්පය නම්වේ. තවද යොදුනක් උස යොදුනක් පුළුල සිදුරු රහිත පර්වතයක් හවුරුදු සියකට වරක් සිනිඳු වස්ත්‍රයක් හැඳගත් කෙනෙකු ඒ මුදුනෙන් යනවිට ඒ වස්ත්‍රය ගැටී පර්වතය ගෙවෙතත් නොගෙවන තරම් කාලයයි උපමාකොට ඇති දීර්ඝකාලයක් කල්පයකි.

ඔබ්බෙහි=පෙර, එහා.
රූපශොභාවෙන්=ශරීරයේ යහපත් ලක්‍ෂණයෙන්.
සම්පත්තීන්=සැපතින්, ඉසුරෙන්. [අළුයි.
අමර=(අ+මර) එනම් දෙවියෝ, මරණයක් නොමැති යනු
අමරවතී=දඹදිව පූරාතන පිහිටි අමරාවතී නම් රාජධානිය.
අයාමෙන්=ඇවෑමෙන්, මරණයෙන් පසු. [කාරයා.
අයකැමියා=ආදායම එකතුකරන්නා, අයවැයබලන්නා, බූදල්
ලේකම්=ලියවිලි, ආදායම් ගණන් ලිපි.
අයවැය=ආදායම් හා වියදම.
මුතුන්මිමුතුන්=මුත්තා (සීයා) හා මුත්තාගේ මුත්තන්.
පරවිට්ටියෙහි=පරම්පරායෙහි.

**2 වන පිට.**

යාචක=සිඟන, සිඟන්නන්.
සත්රුවන්=සප්තරත්නයන්, චක්‍රරත්නාදි සත හෝ මුතු මැණික් ආදිරුවන් සත.
මුවරදසළායෙන්=මල්පැණි සමූහයෙන්, රේණු සමූහයෙන්.
සන්තර්පණයකොට=පිනවා, සතුටුකොට.

( 2 )

කෙළියෙක=ක්‍රීඩාවෙක, සෙල්ලමක.
ලැව්ගිනි=දවාගනි, වනයේ හටගත්ගින්න.
මතැතක්හුමෙන්=මත්තහස්තියකුසේ.
විශ්වකර්මයා=සියලු කර්මදන්නා, එනම් ශිල්පකර්මයෙහි නිපුණ දෙවියෙක්. [භූමිය.
උත්පත්තිස්ථාන= (උත්පත්ති + ස්ථාන) උපදිනතැන, ජන්ම
ත්වක්පත්‍රාදිය=සුඹුල් හා කොළ ආදිය.
පඤ්චාභිඥා=(පඤ්ච+අභිඥා) අභිඥාපස, ඍද්ධිවිධඥානය, (ඍද්ධි ප්‍රභෙද දන්නා ඥානය) දිව්‍යචක්ෂු ඥානය, පරචිත්ත විජානනඥානය (අනුන්ගේ සිත්දන්නා ඥානය) පූර්වනිවාසානුස්මෘතිඥානය, දිව්‍යශ්‍රොත්‍රඥානය යනපස.

අෂ්ටසමාපත්ති=අටවිධධ්‍යානය, ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ යන රූපාවචර සතර ධ්‍යානයද ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන අරූපාවචර ධ්‍යාන සතරද යන අට.

ධ්‍යාන=දැහැන, භාවනාකිරීම.

සසරවැද=සංසාරයට පැමිණ, භවොත්පත්තියට පැමිණ.

සමතිස්පෙරුම්=පාරමිධර්ම සමතිස, දශපාරමිතා, දශඋපපාරමිතා, දශපරමාර්ථ පාරමිතා යන තිස.

පාරමිතාදශය නම්–

දානං සීලඤ්ච නෙක්ඛම්මං පඤ්ඤාවිරියෙන පඤ්චමං
ඛන්ති සච්චමධිට්ඨානං මෙත්තුපෙක්ඛා ඉමෙදස.

යනුවෙන් ප්‍රකාශ දාන, ශීල, නෛෂ්ක්‍රම, ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්‍ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්‍ෂා යන මොවිහුයි.

පස්මරුන්=මාරයන් පස්දෙන, ක්ලෙශමාර, අභිසංස්කාරමාර, අන්තකමාර, ස්කන්ධමාර දෙවපුත්‍රමාර යන පස්දෙන.

විදුරස්නෙහි=වජ්‍රාසනයෙහි.

සුදර්ශනවිහාරය=මනාදැකුම් ඇතියනු තේරුමඇති විහාරයක්.

ගඞ්ගාප්‍රවාහයක්=ගංගාවක ගලායන දියපාරක්, ගලන ගංගා ජලයක්.

කොල=බොල, එම්බල.

## 3 වන පිට

වහන්දෑ=වහන්සේ, වහන්සේලා.

උදයගිරි=සූර්‍ය්‍යා උදාවන පර්වතය, මෙහි පර්වතයක් නොවූවත් උපචාර වශයෙන් උදැගිරියයි කියනු ලැබේ.

කුළුනැමතිවොටුන්නෙහි=මුදුන් නැමති ඔටුන්නෙහි.

පද්මරාගමාණික්‍යයක්= පියුම්රාමැණික, නෙළුම්මල්වැනි රක්තවර්ණයෙන් බබළනමැණික.

එසමයෙහි= ඒකාලයෙහි.

සෙවුනා අදහසින්=භාවිතය කරන කල්පනාවෙන්, පරිභොග කරන අදහසින්.

රත්හුගසා බෙදන්නාසේ= රතුහූලක්ගසා කොටස්කරන්නාක් මෙන්.

විලාසයෙන්=ආකාරයෙන්.

රම්‍යනම් නුවර=රම්ම (ගම්) නම් නගරය.

( 3 )

මඟුල්පටහ=මඞ්ගල්‍ය බෙරවැයීම.
සරසව්දැසි=සරසතුදැසි අලඞ්කාරකරනු දැසි.
මොහ=මූඪකම, මුළාව, අඥානකම.
ළහිරුමඬල=උදයේ සූර්‍යමණ්ඩලය, අධිකරශ්මියෙන් විශුක්ත
හිරුමඬල.
ළපලලවයට=ළාකොළ සමූහයට, අලුත් දළුසමූහයට.
ළැව්ගිනිකලඹක්=වනයේම වෘක්‍ෂයන්ගෙන් උපන් ගිනි සමූ
හයක් (ගිනිගොඬක්)
අභිසංස්කාර=රැස්කිරීම්, පිළිවෙල කිරීම්. [මක්.
හෙදමන්ත්‍රයක්= වෙන්කරන මැතිරීමක්, කඩකිරීමට මැතිරී
වශවර්තීමාරයා= වසවත්මරු, සිදුහත් බොධිසත්ත්වයන්ට
බුදුවීනොදෙමි"සි පැමිණි එනම් මාරයා.
සෙණක්=හෙණයක්, අකුණක්.
දනව්සැරිසරා=ජනපදයක් පාසා ගමන්කර.
තෙලෙ=ඔය, අර.
ඔබවඩනාමග=උන්වහන්සේ වඩිනාමාර්ගයෙහි.
කප්සුවහසකින්=කල්ප දශසහස්‍රයකින්, කල්පලක්‍ෂයකින්.
තිලෝගුරු= තුන්ලෝකයට ආචාර්‍යවූ ස්වර්ග, මර්ත්‍ය, පාතාල
නොහොත් රූප, අරූප, කාම යනු තිලොවයි.
ශර්කරා=සකුරු.
වක්කමක්=වක්කුළු අඟක්, සකුරු උණුකොට බහලන වක්
කුළු අඟක්.
ප්‍රීතිරසයෙන්=ප්‍රීති නැමති රසයෙන්.
සන්තාන=සිත්, සිතිම්,
දෙව්දුවක=දෙවතා දූවකුගේ.
ගිලිහීබිමහුණු=ගැලවී බිම වැටුණු.
රත්නකඤ්චුකයක්=රුවන් පඤ්චුවක්.
පර්වතප්‍රාන්තයක්=පර්වත අද්දරක්, කඳුකෙළවරක්.
කඳුරැළියක්=කඳුවලින් ගලායන දියපාරක්, ගිරිකඳුරක්.
පරසතුමලින්=පාරිජාත පුෂ්පයෙන්, දිව්‍යලොකයෙහි පිහිටි
පාරිජාත වෘක්‍ෂයේ මල්වලින්.
කඩුපුල්මල්=නාලොව මල් විශෙෂයක්.
මෙරපත්ලෙන්=මහමෙර පාමුලෙන්.
කප්රුකින්=කල්පවෘක්‍ෂයෙන්, කප්රුක්සපුසෙකි.
දුහුල්=(කල්පවෘක්‍ෂයෙහි ලනලද) දුකුලවස්ත්‍ර, කොමුරෙදි.

රහතන්=ක්ෂීණාශ්‍රවයන්, කෙලෙස්නැසූවන්, සෘඩිබලය ඇත් තන්.

## 4 වන [illegible]ව.

රුක්පෙළක්=වෘක්ෂපංක්තියක්, ලොකුගස් පෙළක්.
කප්ගිනිගත්=හාත්පස ගිනිගත්, වටේට ගිනිගත්.
රුවන් මෙරක්=රත්නපර්වතයක්.
සවණක්රැස්=සයආකාර පාටින්යුත් රශ්මීන් නිල, පීත, ලොහිත, අවදාත, මාංජිෂ්ඨ, ප්‍රභාස්වර යන පාට සය.
ඡද්දන්තනම්හස්තියා=ඡද්දන්තවිලෙහි වසනඇතා, දත් සයක් ඇති ඇතා.

සහම්පතී=එනම් මහාබ්‍රහ්මයා. (4)
සරස්ධුරය=කුඩය ඇල්ලීමේ තනතුර, ඡත්තග්ගාහකධුරය.
සප්තබොධ්‍යඞ්ගධර්ම=බුදුබව පතන්නහුගේ සත්ආකාර ධර්ම, සමාධි, සති, ප්‍රීති, පස්සද්ධි, වීරිය, ධර්මවිචය, උපෙක්ෂා යන සත.
වෙලාන්තය=වෙරළ, සමුද්‍රයේ ඉවුර.
තරඞ්ගපඞ්ක්ති=රළ පෙළ.
ලවණරසයෙන්=ලුණුරසින්.
මෛත්‍රීරසයෙන්=මෛත්‍රීය නැමති රසයෙන්.
මධුරවූ=මිහිරිවූ.
බ්‍යාමප්‍රභා=බුදුන්ගේ ශරිරයෙන් නිකුත්වූ බඹයක් පමණවූ රැස් සමූහය.
උදානශබ්ද=ප්‍රීතිශබ්ද, ප්‍රීතිහඬ.
ධ්වනි=හඬ, ඝොෂාව.
පොදබාරු=පොදවහනයවීම, පොදවැටීම.
මෙඝයා=වලාහකයා, වැස්ස.
ත්‍රිකූට=තුන්කුළු, ශිඛරතුන, සුවෙල නම් පර්වතය.
සප්තධර්මනැමති=සත්ආකාර ධර්මනැමති.
අලින්ද=පිළ, ගෙයි එකපැත්තක් හෝ ගෙයි ඉදිරිශාලාව, ඉස්තොප්පුව (අභිධානප්‍රදීපිකාව බලා විස්තර දත යුතුයි.)
සිවුවනක්පර්ෂද්= සතර ආකාර පිරිස, බ්‍රාහමණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සතරකුල පිරිස.
සතරමාර්ගඥාන=සොවාන් සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන මාර්ගය පිළිබඳ නුවණ, සතර මගට පැමිණෙන නුවණ.
අෂ්ටවිධලොකධර්ම=ලාභය, අලාභය, අයසය, යසසය, නින්දාවය, ප්‍රශංසාවය, සුඛය, දුකය යන පැවතුම් අට.

අනන්ත=(න+අනන්ත) කෙළවරක් නැති, බොහෝ.

**5 වනු පිට.**

ලෞකිකොපමා=(ලෞකික+උපමා) මේ ලෝකයේ පැවතුම් සම්බන්ධ උපමා.

ධර්මොපමා=(ධර්ම+උපමා) ධර්මය පිළිබඳ සමාන කිරීම, සමාන ධර්මකථා

ලොකොත්තර=(ලොක+උත්තර) ලොකයෙන් උත්තර, ලොක ස්වභාවට වඩා උසස්.

රාජසූකුමාරයේක=මොලොක් රජකෙනෙක්වනසේක. නො දැඩි රාජ්‍යයක.

බුද්ධසූකුමාරවනසේක=මොලොක් බුදුකෙනෙක් වනසේක.

අඩාලහෙයින්=බාගයක් හෙයින්, අසම්පූර්ණ හෙයින්.

කළල්ව=මඩව. [අටක්.

අටෝරුසියක්=(අට+උතුරු+සියක්) අටක් වැඩි සියක්, එකසිය

මගුල් ලකුණෙන්=මඞ්ගල ලක්ෂණයෙන්.

ප්‍රභාසාරය=කාන්තියෙන් බැබළීම අධික බව.

රන්පෝරුහෙයක්=රනින් සැදූ ලෑලි ඒදණ්ඩක්.

වල්කල=සුඹුල් පොතු.

අඳුන්දිවිසම්=අඳුන්වර්ණ ඇති කොටිහම්.

සිව්පිළිසිඹියාපත්=අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන යන සතර විධ මනාදැනීමට පැමිණි, චතුපටිසම්භිදාප්‍රාප්ත ඥානයට පැමිණි.

අශරණීය=සරණක් නැති බවට පැමිණි.

( 5 )

සූවිසි අසංඛයක්=අසංඛ්‍ය විසිහතරක්.

බොධිසම්භාර=බුදුබව පිරීම, බුද්ධත්වය පිණිස පූරන පිරීම.

කල්පවෘක්ෂය=කප්රුක, ඉල්ලූදෙය ලැබේයයි සලකන ගස, කල්පරුක් පසෙකි.

සර්වඥතාඥාන=ආවර්ජනා විශෙෂයෙන් සියල්ලදේ දන්නානුවණ.

අමාඵල=අමෘතඵල, දිව්‍යභොජනීයඵල.

සමෘධවේද්‍යොහෝසි=වැඩිවේද්‍යොහෝසි.

අෂ්ටාඞ්ගයෙන් යුත් ශබ්ද=අඞ්ගඅටෙන් යුත් ශබ්ද, විස්සට්ඨ, විඤ්ඤෙය්‍ය, මඤ්ජු, සවනීය, බින්දු, අවිසාරි, ගම්භීර නින්නාදි යන ශබ්දඅට.

**6 වන පිට.**

* ජටාධරවූ=ජටාව දරන්නාවූ; ජටිලයාවූ. [තෙජස.

තපෝතෙජස්=(තපස්+තෙජස්) තපස් කෙනෙකුට තිබියයුතු

කිඹුල්වත්=කපිලවස්තුපුරය, කපිලතපස්වි විසූ වනයෙහිවූ හෙයින් ඒනුවර කපිල නම්විය.

---

* ගාථාවල සන්නය උපග්‍රන්ථයෙහි අඩංගුවේ.

ප්‍රසූතවී=බිහිවී, ඉපිද.

එකුන්තිස්වසක්=(එක්+උන්තිස්) විසිනවවසක්.

මහාභිණික්මන්=තපස් පිණිස ගිහිගෙයින් පිටත්වයාම.

තුන්යලක්=තුන්වරක්.

පැදකුණුකොට= ප්‍රදක්ෂිණකොට, ගෞරවයෙන් දකුණට කැරකැවී.

ඇසතුබෝරුක=අශ්වත්ථබෝධි වෘක්ෂය, ඇහැටුබෝගස.

විසානකත=වෛශාඛනක්ෂත්‍රය,නකත් 27න්16යවන නැකත.

අග්‍රොපසථායක= (අග්‍ර+උපසථායක) ප්‍රධාන උපසථායකයා සමීපයට පැමිණ සත්කාර කරන ප්‍රධානියා.

විවරණදී= ව්‍යාකරණදී, ප්‍රකාශයදී.

යුගඳුරු=යුගන්ධරය, මහාමෙරවටා පිහිටි සප්ත පර්වතයෙන් ප්‍රධානඑක, මහෙන්ද්‍රානම් පර්වතය.

මහෙන්ද්‍රා මලයඃ සහ්‍යඃ ශුක්තිමාන්, සෘක්ෂපර්වතඃ
වින්ධ්‍යශ්ච පරියාත්‍රශ්ච සප්තෛතෙ කුලපර්වතාඃ

යනු සප්තකූටවලට සංස්කෘත පොත්වල ව්‍යවහාර නාමයි.

සස්නෙන්=ශාසනයෙන්, ආගමෙන්.

(6)

අධිගමයක්=පිළිගැනීමක්, දැනීමක්.

අධිගමලබමෝවයි=ඥානය ලබම්හයි, පිළිගැනීම ලබම්හයි.

බුද්ධකාරක ධර්මයන්=බුද්ධත්වය සිද්ධකරන ධර්ම.

## 7 වන පිට

එකත්පස්ව=එකපැත්තකටවී, මූණට මූණලා නොසිට ගෞරව වශයෙන් පැත්තකටවී සිට.

අනුමෙවෙනිබණ=වැළඳීමට අනුව දෙසන ධර්මය, අනුමෙවෙනියනු අනුමෝදනාවයි.

කාමයන්ගේ=රාගාදී ආශාවන්ගේ.

ආදීනව=දොස, අගුණ.

ලාමකබව=මෝඩබව, දුරනොදක්නාබව.

සකිලිටිබව=කුණුසහිතබව, කිලුටුකම.

අනුසස්=ආනිසංසය, බලය, මහිමය.

ත්‍රිවිද්‍යායෙහි=තුන්ප්‍රකාර විශෙෂ දැනීමෙහි, පෙරවිසූ කඳ පිළිවෙල දන්නා පූර්වනිවාසානුස්මෘතිඥානය, දිව්‍යචක්ෂු නම් දිවසින්දන්නා නුවණ ආශ්‍රවක්ෂයකරඥානය නම්වූ කෙලෙසුන් නැසීමෙන්වන ඥානය, යන තුන් ඥානය. [බලනු )

ෂඩ්අභිඥායෙහි=විශෙෂයෙන් දැනීම්සය. (පඤ්චාභිඥා යනු

නිරුපධිශෙෂ= (නිර්+උපධි+ශෙෂ) නැවත උත්පත්තියෙන් තොරවූ.

නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන්=උපධි සැපයෙන් නිර්ශෙෂවූ නිර්වාණයෙන්, නිර්වාණ ධාතුව වනාහි සොපධිශෙෂ හෙවත් කෙලශපරිනිර්වාණය නිරුපධි හෙවත් සකන්ධපරිනිර්වාණයයි දෙයාකාර වේ.

අෂ්ටසමාපත්තිය= 2 වන පිට සම්බන්ධ විස්තරය බලනු.

රන්හුලින්=රත්රන් උළුවලින්.

සූත්‍රපිටකය=බුදුන් වදාළ දික්, මැදුම්, සංයුත්, අඞ්ගුත්තර, කුදුගොත් යන සඟී පසින් යුත් බුද්ධධර්මය.

කෙළලක්‍ෂයක්=කෝටිලක්‍ෂයක්, ලක්‍ෂයේ ඒවා කෝටියක්.

සක්විතිරජව=චක්‍රවර්තිරජව, චක්‍රරත්නයේ බලයෙන් රජ කරන රජු, චක්‍රරත්නය නම් සක්විති රජුන්ට පිනින් ලැබෙන සෘද්ධියෙන් යාහැකිවූ රත්නයකි.

## 8 වන පිට.

අභිධර්මපිටකය=බුදුන් විසින් දෙවියන් ප්‍රධානව වදාළ ධම්මසඞ්ගණී, විභඞ්ග, පුග්ගලපඤ්ඤත්ති, ධාතුකථා, මූලකථා, යමකකථා, පට්ඨානකථා යන සත්ප්‍රකරණය.

විනයපිටකය=පාරාජිකා, පචිති, සුළුවග, මහවග, පරිවාර යන සඟී පසින් යුත් බුද්ධධර්මය.

පඤ්චාභිඥා= පස්අයුරු වෙසෙසා දැනීම්- ඔච්හු නාම්- සෘද්ධි ප්‍රභෙද දැනීමේ නුවණ, දිව්‍යකනින් අසා දැනගැනීමේ ඥානය, අනුන් සිත් දැන ගැනීමේ නුවණ, පෙරවිසූ ජාතිපරම්පරා දැනීමේ නුවණ, දිවැසින් බැලීමේ නුවණ. [යෙන්.

අපරිහීනධ්‍යානයෙන්= (අ+පරි+හීන+ධ්‍යාන) සම්පූර්ණ ධ්‍යාන

බුද්ධකෘත්‍යයන්=බුදුවරයකු විසින් කළයුතු ක්‍රියා.

සිරියෙල්=හිරියල්.

පැනට=වතුර පිණිස.

මහාබොධිසත්ත්ව=බුදුබව පතන මහතාණෝ.

දෙයාසඞ්ඛ්‍ය=(දෙ+අසඞ්ඛ්‍ය) අසංඛ්‍ය දෙකක්.

ගෞතම=ගොතම, එනම් කුලයෙහි උපන් සිද්ධාර්ථනාම් බුදුරජාණෝ.

ව්‍යාකරණ=විශෙෂයෙන් ප්‍රකාශකිරීම, විවරණය; විවරණනාම් බෝසත්කෙනෙකු දුටුකල බුදුකෙනෙකුන් විසින් මේ තෙමේ අසවල් කලැ අසවල් නමින් බුදුවන්නේයයි කරනලද ප්‍රකාශයයි.

## 9 වන පිට. (8)

දිව්පිළි සඟලක්=දිව්‍යමය වස්ත්‍රදෙකක්.
ආරාමකාර්‍ය්‍ය=ආරාම සම්බන්ධ කටයුතු.
අසඞ්ඛ්‍යයක් කප්=කල්ප අසඞ්ඛ්‍යයක්.

## 10 වන පිට.

අගාමක=ග්‍රාමයක් නැති, ගමක නොපිහිටි, ගම නම් මිනිසුන් වැඩිගණනක් ගෙවල්තනා ගෙන වාසය කරන පෙදෙසෙකි.

අරණ්‍යයෙහි=කැලයෙහි, වනයෙහි.

සිංහයොනියෙහි=සිංහජාතියෙහි, සිංහදෙනුවක කුසයෙහි. "සහ යොන් සතුන් කියලූ-සඳ ඉතිරි ලිඟුනම්."

නිරොධසමාපත්තිය=අටවනු සමාපත්තිය, නිරොධයනම් නිර්‍වාණයයි; අෂ්ටසමාපත්ති යනුබලනු.

සමවැද=ධ්‍යානය පිණිස පැමිණ.

ප්‍රව්‍රජ්‍යාවෙන්=පැවිදිවීමෙන්, මහණවීමෙන්.

අනාථයන්ට=නාථනොවන්නන්ට, පිහිට නැත්තන්ට, බල හීනයන්ට; නාථශබ්දයෙන් ප්‍රධාන බව කියත්.

## 11 වන පිට.

භද්‍රකල්පයට=එනම් කල්පයට. භද්‍රයන්නෙන් මඞ්ගල්‍ය, උතුම් උසස්, හීනනොවන අර්‍ථගෙනදේ.

ජටිල=ජටාවක් ඇත්තා යනුයි.

මහරැටියක්ව=රටනායකයෙක්ව, මහා ජනප්‍රධානියෙක්ව.

අසමසම=අසමානයන්ට සමවූ, බුදුවරයන් වහන්සේට සමවූ වෙක් නොමැත්තේය යන අර්‍ථයෙන් අසමසම නම් වේ. අසමනම් බුදුන්ට සමහෙයින් අසමසම වන් නේය.

සුමෙධ=මේධයෙන් බබලන්නේය යන අර්‍ථයි.

උත්තරනම් මානවකව ඉපිද=උත්තර නම් තෙමේ මානවකවූ සමයෙහි සුමෙධබුදුන් හමුවටපත්වූ බැව් මෙයින් ප්‍රකාශකෙරේ.

බුදුපාමොක්=බුදුන් ප්‍රමුඛව, බුදුන් ප්‍රධානකොට ඇතිව.

සතර මහාවීපයේ= මහාඞීපසතරේ සතරමහාවීපයෝ නම් ජම්බූවීපය, උතුරුකුරු දිවයිනය, අපරගොයානය, පූර්‍වවිදෙහය යනුවෙත්.

අතම් කාර්‍යය=තමාගේ කටයුතු.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



## 12 වන පිට. (11)

තුන්වේද=ත්‍රිවේද, ඍග්, යජුර්, සාම යන වේදතුන, මේවේදයෝ මහාබ්‍රහ්මයා විසින් ප්‍රකාශකරන ලද්දෝ යයි හින්දු දේශවාසීහු විශ්වාස කෙරෙති. ඍග්වේදයනම් ප්‍රථම වේදයයි. ගිනි වායු ආදිය දෙවතා කොට ඔවුන්ටත් දෙවියන්ටත් සතුති යාච්ඤාකරන ශාස්ත්‍රයයි. යජුර්වේදයෙහි දෙවතාවන්ට කරන පූජායාච්ඤා ක්‍රමය ප්‍රකාශයි. ඒ කෘෂ්ණය ශ්වේත යයි විවිධාකාරයි. සාමවේදය නම් ගීතිකා සින්දු වෘත්තවලින් යාච්ඤාකිරීම ප්‍රකාශ කරනලද ශාස්ත්‍රයයි.

මඳුරු=මඳුර, පරසතු, ජූරිජාත.

දශබලධාරී=බලදශයක් ධරන්නාවූ.

එකානුවන=අනූඑක්වන.

## 13 වන පිට.

උග්‍රවූ=උසස්, තද, නපුරු වැඩි.

ඉෂ්ටාර්ථයෙන්=(ඉෂ්ට+අර්ථයෙන්) කැමතිවන ලද අභිප්‍රායෙන් ගහපත් අර්ථයෙන්.

(12)

යශොපරිවාර=(යශස්+පරිවාර) කීර්තිය හා පිරිවර.

ඍද්ධ්‍යනුභාවයට=(ඍද්ධි+අනුභාවයට) ඍද්ධිබලයට, අහසින් යාම් ආදි මහබලයට.

දිවමඳුරුපියුම්=දිව්‍යමඳුරපුෂ්පයන්.

සිවුවනක් පිරිස්=සතර ආකාර සෙනග, බ්‍රාහම, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සතර වර්‍ගයට අයත් සේනාව නොහොත් සිවුපිරිවරයි. එනම් මහණ මෙහෙණි උපාසක, උපාසිකායි

## 14 වන පිට. (13)

කප්පියභාණ්ඩ=සඞ්ඝයාවරුන්ට කැපවූ බඩු, ශ්‍රමණ පරිෂ්කාර.

සස්න=ශාසනය.

## 15 වන පිට.

අඳුන්=අඤ්ජනය, ඇසේ ගානා අඳුන.

සස්න=ශාසනය.

ගිලන්=මහලුකමින් ලෙඩව, රොගාතුරවීම, පිඩාවට පැමිනීම.

(14)

පතතෘණණදෙශය=පටවසත්‍ර උපදිනදෙශය, මිශ්‍ර(මිසර)දෙශය වියහැකියි.

දිනදෙශය=චීනදෙශය, චීනරට.
කොසෙය්‍යපිළි=සේදවසත්‍ර, පටවසත්‍ර.
පලස්=කම්බිලි, ඝන රෙදි විශෙෂයක්.
දුහුල්=දුකුලවසත්‍ර, පට්ටාපිළි.
රත්පටක්=රන්දෑමයක්, රත්රන්මාලයක්.
ඝටීකාර=කු[illegible]යන් (කළගෙඩි) සාදන්නා, කුඹලා, මෙකල බඩහැලයායයි කියනු ලැබේ.
වතාවත් සැපතින්=උපස්ථාන සැපයෙන්.

**16 වන පිට.**

විවරණලත් නියාව=විවරණ ලැබූ අන්දම.

**ප්‍රථමකථා නිමි.**

---

සූවිසි=(සිව්+විසි) විසිහතර, (වකාරයාගේ ලොපය හා වකාරස්ථ උකාරයාගේ ලොපයද සකාරයාගේ පිළිවිපය්‍යාසයද සිඩයි.)
සමත්‍රිංශත් පාරමීධර්මයන්= සමතිසක් පෙරුම්දම්, දශපාරමිතාය, දශඋපපාරමිතාය, දශපරමාර්ථපාරමිතා යන තිස.
විශ්වන්තරනම්භාවයෙහි=වෙස්වන්තර නම් රජයෙක්ව ඉපදි ජීවිතයෙහි.
කුශලසම්භාර=කුශල්රාශිය, කුශල්භාරය.

(15)

ආයුඃප්‍රමාණයෙන්=ආයුෂ පමණින්.
සක්වල=චක්‍රවාට වල.

**17 වන පිට.**

අනිත්‍ය=(අ+නිත්‍යය) නිත්‍යභාවයක් නැති; ස්ථිරව නොපවත්නා.
දුක්ඛය=දුකය
අනාත්මය=තමාය කියන්ට යමක් නැති ස්වභාව
“මමය මාගේ මේ - සිත වරදවා දැනු මේ
බලා අඩුරුව මේ-සොඳුරු ලියකැයි සිතා වැනි මේ”
අභිසමය=දැනීම, අවබොධය.
නෛය්‍යාණික=කිලෙසටම පමුණුවන ස්වභාව ඇති, නිර්වාණයට අයිති.
මෙර=මහමෙර, මේරුපර්වතය.
අනික්තුන් මුහුණ=අනික් තුන්පැත්ත.

වෛශ්‍යකුලය=වෙළඳකුලය ආඪ්‍යකුලය,
ක්‍ෂුද්‍රකුලය=කුඩා කුලය, හීනකුලය, ශුද්‍රවංශය.
ලෝකසම්මතය=ලෝකයෙහි (උසස්යයි) නියමයෙන් පිළි ගන්නා ලද්ද.
සුරාධූර්තනොවෙති=රාමෙරයපානය කරනතක්කඩි නොවෙති. ධූර්තශබ්දයෙන් වංචා,තක්කඩි යන අරුත්ගෙනදේ.
අඛණ්ඩවූ=ඛණ්ඩනොවූ, නොහෙදවූ, නොකැඩුණු.
පඤ්චමහාවිලෝකනය=මහපස්බැලුම, බුදුකෙනෙකුන් ලොව ඉපදීමට පෙර කාල, දීප, දෙශ, කුල, මවු යන පස කෙරෙහි මනාසේ කරන බැලීම. i කාලවිලෝකනය නම් මනුෂ්‍යයන්ගේ අතිහීන නූවූද ඉතා අධික නූවූද කාලය වෙසෙසා බැලීමයි. ii දෙශ විලෝකනය නම් ප්‍රත්‍යනානූවූද බුදුවරයන්ගේ උත්පත්තිස්ථානයවූද බුද්ධශාසනය පැවැත්වීමට නිවාසිවූද මධ්‍යදෙශයක් වෙසෙසා බැලීමයි. iii දීපවිලෝකනනම් බුදුවරයන්ගේ උත්පත්තිය නිත්‍ය උත්පත්තියට හෙතුවූ ඊපයවෙසෙසා බැලීමයි. iv කුලය වෙසෙසා බැලීම. v සුදුසු මෑණියන් වෙසෙසා බැලීම. එයින් කීහ.

"කාලං දීපංච දෙසඤ්ච කුලං මාතර මෙවච
එතෙ පඤ්චවිලොකෙත්වා උප්පජ්ජන්ති තථාගතා"යි

ප්‍රතිඥා=පොරොන්දු, ගිවිසුම්.
සමුදී=අවසරදී, අවසර ලබා.

## 18 වන පිට. (16)

විගත සුරාපාන ඇති=හරනලද සුරාපානය ඇති.
අෂ්ටාඞ්ගසීලය=අඞ්ගඅටකින් යුත් ශීලය, අටසිල්.
සතරවරම් රජදරුවෝ=චාතුර්මහාරාජික දෙව්රජහු. ඔව්හු කවරහයත්? විරූඪ, විරූපාක්‍ෂ, වෛශ්‍රවණ, ධෘත-රාෂ්ට්‍ර යන සිවුදෙනයි.
අනවතප්තවිල=හිමාලවනයෙහි පිහිටිවිලක්, හිරුරස්නයෙන් නොතැවෙන්නේය යන අරුයි.
දෑවාණිඅතලෙක=පළිඟුගල් තලාවක.
අලතාපිරියම් කළාක්වැනි=ලාකඩවලින් (පරිකර්මය) පිළියම් කළාක්සේ, ලාකඩවලින් රතුවට සාදා වාත්තු කළාසේ, මෙයින් තොල්වල රක්තභාවය හා මට සිලුටුභාවය හැඟවූහ.

කෛලාශපර්වතය=එනම් පර්වතය, හිමාලපර්වතයේ මුදුනක්, කුවේරයාගේ වාසයවූයේ මෙහියි.

දකුණුළැය=(දකුණු+ඇළය) දක්ෂිණ අංශය.

තුෂිතභවනය= තුසිතනම් දිව්‍යලොකය, තුසිතයනු එහි සන්තුෂ්ටිය ඇත්තේ යන අඵයි.

සෞමනස් සහගත=සතුටින් යුක්ත.

ඥානසම්ප්‍රයුක්ත සංස්කාර කුශලචිත්තය= නුවණින් බැඳුණු සංස්කාර කුශලින් යුක්තසිත.

විපාකචිත්තයෙන්=දෙවරක් පිරිසිඳුකරනලද සිතින්.

අග්‍රමහසව්වෝ=මහාශ්‍රාවක අග්‍රපිරිස, ශාරිපුත්‍ර, මුගලන් ආදි කොට ඇති අග්‍රශ්‍රාවක අග්‍ර නම.

පසේබුදුහු=ප්‍රත්‍යෙකබුදුහු, තමන්ට නිවන් දක්කහැකි අන්‍ය පුද්ගලයන් නිවන් දක්විය නොහැකි බුදුහු.

චුතික්ෂණයෙහි=චුතවන කෙණෙහි.

චුතිචිත්තය=චුතවයාමේ සිත.

ප්‍රතිසන්ධිචිත්තය=පිළිසිඳ ගැනීමේ චිත්තය.

සතරවනගර්භාවක්‍රාන්තියෙන්=සතර ආකාර කුසපිළිසිඳගැනීමෙන්.

ධර්මකථිකයක්හුමෙන්= ධර්මදෙශනා කාරයකුමෙන්, ධර්මකථා කාරයකුසේ.

මණිබන්ධයෙන්=මිණිබහනෙන්, මැණික් කටුව.

ජ්‍යොතිරසගමාණික්‍ය=ස්වභාවයෙන්දිලිසීමෙන්යුක්තමැණික දැරගුම්ණ, රතුකැටය, පළිගුමැණිකයසිද කියත්.

රත්පලස්හුයක්=රතුකම්බිලි නූලක්.

## 19 වන පිට. (17)

යුගාන්තවාතසාගරතරඞ්ගපඞ්ක්තියක්=යුගය කෙළවරවීමේදි වාතයෙන් සාගරය චංචලවී නගින රළපෙළක්.

"ප්‍රලයෙ භිත්තාමයඤාද භවන්තිකිල සාගරඃ."

අත්සත්කොට=අතින් සංඥකොට.

උද්දාම සාගරයෙහි=රළින් උඩට නැගීගිය සාගරයෙහි.

උද්දාම=එසවීම.

කල්පලතාවක්=කප්ලියක්.

රන්ලිය වනයක්=ස්වර්ණලතා වනයක්.

චිත්‍රලතාවනය=ශක්‍රයාගේ එක් උයනක්.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



පස්වනක් බඹරගණන්=වර්ගපසෙක බමර සමූහයන්.

කුල්මතින්=උඩඟුවෙන්.

රන්සිව්ගෙය=ස්වර්ණමය දෝලාව.

මඟුල්සල්ගස=රජුපැමිණ ගිම් නිවීම් ආදිය කරන සෙවණ යට අසුන් පිහිටි ශාලවෘක්ෂය.

රුක්පෙළද=වෘක්ෂපංක්තියද.

මෘදඞ්ග=මිහිඟුබෙර, මෙඝධ්වනිය, අහස් ගිගිරීමේ නාදය.

සිසාරන් නාක්මෙන්=වටකරන් නාක්මෙන්.

මෘගාඞ්ගනාවන්=මුවදෙනුන්.

හංසාඞ්ගනාවක්=හංසධෙනුවක්.

ළපල්ලවයන්=ළාකොළ, ළාපත්‍ර.

හස්තපල්ලවය=අතුල්තලය, අතුල්තල නැමති පත්‍රය.

තුලනාකොට=සමානකොට, තුල්‍යකොට.

රන්කම්කළ=රත්රන්වැඩකළ, රනින් විසිතුරු වැඩකළ.

කොමුපිළියක්=දුහුල්වතක්, පට්ටවස්ත්‍රයක්.

මසක්හු=මත්ස්‍යයකු.

මැකිණියක=මකුණියක් විසින්.

විළිඳූහ=ප්‍රසවකළහ.

බණපළඟ=වාඩිව බණකියන ආසනය.

**20 වන පිට.** (18)

ප්‍රහීණවූ කාමරාග ඇති=කාම ආශාව නැතිකළ.

සුද්ධාවාසික=එනම් බ්‍රහ්මලොකවාසී.

මඟුල් ගැත්තෝද=මඞ්ගල්‍ය මෙහෙකරුවෝද.

පහස්ඇති=ස්පර්ශය ඇති, ගැහැටීම ඇති.

ස්වර්ණාඞ්කුරයක්= (ස්වර්ණ+අඞ්කුරයක්) රත්රන් පැළෑටියක් පොළොවෙන් නගින මොටෙසියා අඞ්කුරය නම්.

ඒකාඞ්ගනාවූ=එකම මිදුලවූ.

නිදුකාණනි=දුක්නැති උතුමාණනි, දුක්නැත්තාණන්.

කුහුල්ව=සැකව.

උත්තරම්සි=උත්තමයාවෙම්සි, උසස්මිසි.

සුදුපිඹුමෙක්=සුදුමලෙක්.

පිල්ලූ=(පිළු) කොරු, ජාතිකොරු.

කාසශ්වසාදි=කැස්ස හා ඇදුමාදි, කැසිමුසු ආදි රෝග.

ගංගෝ=ගංගාඹයවල්.

## 21 වන පිට.

ශර්කරා=සකුරු.

පස්පියුම්=පඤ්චපද්ම, ඇඹුල උපුල රත්පියුම්, හෙළපියුම්, කල්හාර යන පස.

වෙලෙප්ශාඛාය=මහාශාඛා හා ශාඛා; අතු හා රිකිලි සමූහය.

දෙබුමු=තට්ටු දෙකකින් යුක්ත.

පියුම් වියන්=පද්මවිතානයන්.

මල්ගුළාවක්=මල්ගෝලයක්, මල්ගුළියක්.

නෙවුනා=බබළන, සෙලවෙන.

වල්විදුනා=වාලවිජිනීපත්.

පුෂ්පධූප=මල්දුම්, මාලාධූම.

ගන්ධධූප=සුගන්ධදුම්, ගන්ධධූම.

පරිවාසිතවිය=(සුවඳ) කවන ලද්දේවිය. හෙවත් හැමතැනම (සුවඳ) පිරීගියේවිය.

පොරගින්=සොඬඅගින්.

ජලකණිකායෙන්=ජලඉසින කෙම්යෙන් දියබිඳුවලින්

ඇත්පොව්වන්=හස්තිපොතකයන්, ඇත්පැටවුන්.

(19)

මඬුවන්=මණ්ඩූකයන්, මැඩියන්.

"අග්ගොහමස්මි ලොකස්ස, ජෙට්ඨොහමස්මි ලොකස්ස, සෙට්ඨොහමස්මි ලොකස්ස, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො"යි මෙවනාගී සියලු බුදුවරයන්ගේ සිංහනාද යයි. එහි භාවය- මම (දැන්) සමස්තලෝකයට අග්‍රවූයෙමි, ජ්‍යෙෂ්ඨවූයෙමි, ශ්‍රෙෂ්ඨවූයෙමි, මේ මාගේ අන්තිම උත්පත්තිය වන්නේය, යළිත් උත්පත්තියක් මට නැත්තේය.

ජයතුරුසක=ජයසකත්, ජයසිහිවීමට පිඹිනා සක්ගෙඩිය.

## 22 වන පිට. (19)

නාගමාණවිකාවන්=නාගමාණවියන්, නාලියන්.

වන්දිභට්ටයන්සේ=ස්තුති පාඨකයන්මෙන්, ස්තුති වශයෙන් ගුණවර්ණන විරිදුකාරයන්මෙන්.

පඤ්චසිඛදිව්‍යපුත්‍රයා=පන්සිළු නම් වීණාගායක දෙවතාවා. පඤ්ච=පස, සිඛ=සිළු හෙවත් කොණ්ඩය, මොහට සිළු පසක් ඇති හෙයින් පන්සිළුනම්.

මානයේ=ප්‍රමාණයේ.

ම්ලක්සා=මලක් සමාන.
දෙසිද්ද=(දෙ+ඉද්ද) ඉද්දමල් දෙක, සීනිද්ද, බොලිද්ද දෙක.
සුරභිළුපුල්=සුවඳ මහනෙල් විශෙෂයක්.
පරසතු=පාරිජාත, දිව්‍ය ලොකයේ මල් විශෙෂයක්.
කෝවිලාර=කොවිදාර, යුගපත්, කොබෝලීල.
කුරුකේ=සුවඳ හමන ගොඩමල් විශෙෂයක්.

(20)

සතරයාළ දසාමුණක්=යාල් 4 ක් හා අමුණු 16 ක්, යාළකට අමුණු විස්සකි.
සෙව්වන්දි=රෝසමල්.
සෞගන්ධික=සුගන්ධික පුෂ්ප; ඕලුමල්.
මරුවවිදූවන=මල්විශෙෂයන්.
බෙලුවපාණ්ඩුවීණාව=පන්සිළුගේ තුන්ගව්වක් උසඇති එනම් වීණාව, රබිකිඤ්ඤය. *
ලොහිතඞ්කමය= රක්තමාණික්‍යයෙන් සෑදූ, ලොහිතනම් ලෙහෙසි; ලෙහෙවන් මැණික ලොහිතඞ්කනම්.
කණ්ණාමෘත=(කණ්ණ+අමෘත) කනට අමෘතයක් ලෙස, කනට වැටෙන අමාවක්.

23 වන පිට. (20)

සවාමිදරු සිඟිත්තාගේ= ළදරුවූ සවාමිදරුවාණන්ගේ; බොළඳවූ සවාමිදරුවාගේ.
ධ්‍යානලාභී=ධ්‍යානයට ආශාවත්, ධ්‍යානවත්.
පතුල් සුත්දෙක=පතුල් සුගුදෙක, කුඩාපතුල් දෙක.
ජටාගෙහි=තලප්පාවෙහි.

(21)

ලදපස්මල්= බැදිසුන්සාල්, අබ, තණහාල්, විලඳ, සමන් කැකුළු යන පස.
වෙදය=ඍග්, යජුර්, සාම අථර්ව යන බ්‍රහ්මදෘෂ්ටිය; සතරවෙද ශාස්ත්‍රය.
අටෝරුසියක්=(අට+උතුරු+සියක්) එකසිය අටක්.
ඉඳුල් තොළු=තොළුගා ඉඳුල්කළ ආහාර.
කපිළවන්=පිංගලවර්ණය, ගිනිදැල්පාට
ලක්‍ෂපුස්නා=ලක්‍ෂයක් වටිනා.
සතර පූර්වනිමිත්ත=බුදුවීමට පෙරදුටු නිමිති සතර, ඔවුහු කවරහයත්– ජරාරූපය, ව්‍යාධිරූපය, මෘතරූපය, ශ්‍රමණරූපය,"යනුයි.
අරමණනාස=කෙළවර මොටවීගිය නාසය. ළදරුනාසය.

* බෙලු යනු හිඳී භාෂාවෙ වීණාවට හෝ රබිකිඤ්ඤාව කියන නමයි

එක්මැසිවූකල=එක් මාසයක් ගතවූකල.

**24 වන පිට.**

වප්මගුල්=වැපිරීමේ මඞ්ගල්‍යය.
සේවතුන්=සේවක සත්‍රින්.
ආනාපානචතුත්‍ථධ්‍යාන=ආශ්වාස ප්‍රශ්වාස කිරීමෙන් පවත්නා සතර වන ස්මෘති භාවනාව.

(22)

යසශ්ශ්‍රී=කීර්‍ත්තිශ්‍රීයාව, යසස් හා ශ්‍රීය; දුනුමුඩාව=දුනුකෙළවර.
දැරුභරණය=සත්‍රින් පොෂණය කිරීම.
අඞ්ගීරසකුමාරයෝ=බොධිසත්ත්ව කුමාරයෝ, අඞ්ගිරස් සෘෂිහුගේ ගොත්‍රයෙන් උපන් හෙයින් සිඬාළු කුමාරයෝ අඞ්ගිරස නම් ලබත්, ශරීරයෙන් බඹයක් පමණ රශ්මි මාලාවෙන් යුක්ත හෙයින් බුදුවරයෝ හෙවත් බොධිසත්‍වයෝද ඒ නම ලබත්.

**25 වන පිට.**

හිණිපෙති=ඉණිමංපෙති, ඉණිමංපඩි.
සරත්සමය=ශරත්කාලය.
හීතල ශොභාවෙන්=ඊතල අලංකාරයෙන්.
ජිණ්ණිව්‍යාධිමෘත=ජරා, ලෙඩ, මළමිනී.
විව්පිල් නැමති=වීථි ආශ්‍රිතව පිහිටි පිල් නැමති.
මලස්නෙහි=මල්අස්නෙහි.
පුරසත්‍රි සමූහයා=රාජසත්‍රින් සමූහය.
මනදෙළු=මනඃහී ආශාව; සිත්හී ආශාව. [නම්.
බෑදෑණි=නෑනාකෙනෙක්, සහෝදරයකුගේ භාය්‍යාාව බදෑණි
රූමුහුදෑ=රූපශොභා නැමති සමුද්‍රගුණ ඇත්තා, රූපයේ ලක්‍ෂණය ප්‍රමාණයෙන් කියනොහැක්කාවූ තැනැත්තා යනු හැඟවීමයි.

**26 වන පිට.**

විකාර=වෙනස, පෙරළීම්ගති.
බිම්බාදේවීන්=එනම් දේවිය; යශොධරාදේවිය.
අතුල් සුග=අලුසිගිත්ත, සැඩා අල්ල.
කරවැකුණේනම්=අත තැවරිණිනම්.
මලක්වැත්න=මළපතක්මෙනි, තොණ්ඩුවක්මෙනි.
කාළුක=එනම් බමුණු යාචකයෝ; පව්ක=මාගීඅතර සිටිමින් සිඟමන් ඉල්ලන යාචකයෝ.
පෞරාණික=ව්‍යාසාදි සෘෂීන්කළ ශාස්ත්‍රය දත් හිගන්නෝ.
තාර්කික=තර්කකිරීමෙන් දිවිරැක ගන්න යාචකයෝ.

ගමිකා=ගම්නිවසන හිඟන්නෝ.
වාදිකා=වාදකථාවෙන් දිවිරැකගන්නා හිඟන්නෝ,නොහොත් ගායනාදිය කිරීමෙන් දිවිරකින සිඟන්නෝ.
භට=භට යාචකයෝ; බජ*=කොර, කොරු.
බධිර=බිහිරි හිඟන්නෝ.
පඩගු=අත්පා වසඟනැති හිඟන්නෝ.
ගිලාන=වයසින් රොගාතුරවූ සිඟන්නෝ.
දීනා=දීන, බැගෑපත්.
ෂොඩෂවිධ යාචකයන්=දහසය ආකාර හිඟන්නන්.
සතර අපාය=තිරිසන් යෝනිය, ප්‍රේතවිෂය, අසුරකාය, අපාය යන සතර, සැපයෙන් තොරස්ථානය අපාය නම්.
අසර=මාගී හසර.

## 27 වන පිට. (24)

කාමාදිවිතර්කයෙන්=කාම, ව්‍යාපද, විහිංසා, යන තුන් ආකාර අරමුණෙන්.
උතුරුසළ නකත=උත්තරාෂාඪ නක්ෂත්‍රය, නකත් 27 න් විසි එක්වැන්න.
අට ඉස්ඹක්=බඹ 280 ක් දුර.
බුද්ධාන්තරයක්= (බුද්ධ+අන්තරයක්) බුදුකෙනෙකුට අයත් [කාලයක්
ශ්‍රමණ පරිෂ්කාර=මහණ පිරිකර, පැවිජි කෙනෙකුට වුවමනා කරන පිරිකර.
හන්සළුදෙක=හැඳිවස්ත්‍රදෙක, හැඳිශාටක දෙක.

## 28 වන පිට. (25)

දුෂ්කරක්‍රියා= බොධිසත්වයන් සැපවත් ආහාර පානාදියෙන් ශරීර පොෂණයට ඉඩනොතබා යන්තමක් අනුභවයෙන් විසීමෙන් සයවසක් කළදුෂ්කර ක්‍රියා.
විසානැකත= 8 වෙනි පිට බලනු.
භික්ෂාචාර=පිඬු සඳහා හැසිරීම.
සමවත් සුවෙන්=සමාපත්ති සැපයෙන්.
කෙළෙඹි පුත්‍රයාගේ=ධනවතාගේ, ගෘහපතියාගේ.
තනපාමුල=තනපුඩුමුල, කිරිබුරුල්ල ළඟ
නවුන්= අභිනවවූ, අලුත්"නැවුන්".
උදැගිනිකොට=ලිප්ගිනිකොට දමා.
දැවාණ වටසේ=පළිඟු බුබුලක්මෙන්.
දක්ෂිණාවෘත්තව= (දක්ෂිණ+ආවෘත්තව) දකුණට කැරකැවී.

## 29 වන පිට. (26)

බුහුණනියෙනි=නැගණියෙනි, සහෝදරියෙනි.

වෙලෙව්ව වෙලෙව්ව=ඉක්මනින් ඉක්මනින්.
කනකකටක=රනින් සැදූවළලු.
රසන=බඳපටිය, මෙබලාදමය, "රසන්දම".
නූපුර=පයේලන "ශිලම්බු" * නම් පාවළලු.
තාඩඞග=කණාභරණ, තෝඩු.
එක්වැටිපාමුදු=එක්වටයකින් යුත් පාලනමුදු.
පාසළඹ=පයේලන ආභරණ, වළලු.
පාදංගා=පා වැසුම්, මේස්; ඔරවැසුම්=උරවස්නා ආභරණ.
විජවසත්‍ර=වසත්‍ර විශෙෂයක්, හඳනාවසත්‍ර.
කකුදපාද=පාමුදු, පාදපත්‍ර, පාදඞගුලි, පාදනඛ යන මේවා පාදවල ලන වෙනත් ආභරණ විශෙෂයෝයි.
හසතමුද්‍රිකා=අත්මුදු; කෛපෝට්ටු=අත්වළලු, බාහුවළලු,
රන්සවඩි=රන්හවඩි, රත්රන්මෙබලා.
මණිකෛවළලු=අත්වළලු.
මණිකෛවඩම්=හසතාභරණයක්, මැණික්දම.
කාඳුපාප්පු=අත්වැසුම්; පමුතිලිංගං=වහන් විශෙෂයක්.
පටටකාර=ග්‍රීවාභරණ විශෙෂයක්.
කිඞකිනිකරන්නාසේ=එකක් උඩ අනිකක් තබන්නාසේ.
සුප්‍රතිෂඨිත=මනාසේ පිහිටි.
වසාරොද=පෙකිනියෙහි පටන් පහළට තිබෙන ලොම් පෙළ.
එකාවැළ පලන්=එකාවලිය නැමති පැළඳීම්. දසරුවෙන් උර යක් පන්නා ලනමාලය.

**30 වන පිට. (27)**

කාලනාගරාජයා=එනම් නාගරාජයා; තුන්පය=ප්‍රාසාදතුන.
දිවාවිහාරකොට=දවල්වි සීමකර, දවල් වාසයකර.
රසාතලයෙහි=එනම් නාගලොකයෙහි, අතල, විතල, මුතල රසාතල, තලාතල, මහතල, පාතාලයන නාලෝ සතින් එකක්.
රන්ඇගෑය=සවණී අග්ගිකාව, රන්ගෙඩිගේ.
සුවඳවිතක්=පුෂපභාජනයක්.
කුසතණ=කුශතෘණ, ඉලුක් විශෙෂය,
සතර වියඝාධිෂඨානයෙන්=සතර අඞගයකින් යුත් වීයඝ අධිෂඨානය, ලේ මස් වියළීගොස් සම්නහර ඇටශෙෂ වෙතත් අත්නාරිම් කරන අධිෂඨානය.

**31 වන පිට. (27)**

සන්තුසිත=එනම් දෙව්ලොව; සුසාම=එනම් දෙව්ලොව.

---

* ශිලම්බු යනු හඬ නඟින වළල්ලට දෙමළෙන් කියන නාමයයි. ද්‍රවිඩ ස්ත්‍රීයෝ මෙය බොලට මතුවේ පළඳිත්.

විෂය=බලය, තත්වය; වසවත්තිමාරයා=වසවත් මාරයා.

**32 වන පිට. (28)**

දසබිම්බරක් සෙනාව= (දශභූම්බාරයක්) බිම්බරදසයක් සේනාව, සේනාබිම්බරයක් නම් පෘථිවියේපැත්තක සිටිකල අනිත්පැත්ත මතුවනතරම් මහත්සේනාවක් බැව් කියාතිබේ.

කියටි=කියනාදේ.

අඳුන්කුළක්=අඤ්ජන කූටයක්, ගිනිකන්දක්.

යමුගුරක්=යකඩ මුගුරක්, යකඩ පොල්ලක්.

ඉඟිකරුව=ඉතාඕනෑකමින්.

ඇණිලා=යුධසමුඳුතබා, බළසෙනඟ සිටවා.

සැහැසී=කෝපවී, තරහයෙන්.

භාස්කර හංසරාජයකුසේ= සූර්‍ය්‍යයාමෙන් බබළන තෙජවත් හංස රාජයකුමෙන්.

**33 වන පිට. (29)**

වාමාවෘත්තව=වම්දෙසට කරකැවී, වමට හැරී.

පංශුකදම්බයෙන්= පස් රාශියෙන්.

උන්නාදයක්සේ=උස්හඬක්සේ.

හකුරු සමූහයෙන්=ගල්කැට සමූහයෙන්.

උල්කා=තරු, තාරකා.

ජාලාකවුළුව=දැලක්මෙන් සිදුරු සහිත කවුළුව.

(30)

හිපගිළිය=ඊතලයේ මුල; ලකැසි=ඉලක්කය කැසී.

අනුරාගය=ඇල්ම.

අඩයටිගෙන=දමාගසන හෙල්ලයක් ගෙන.

චීපලක්=චීපලසක්, චීමල්ලක්.

සමක්බරලන්නාසේ=හමක්වේලීමට බිම බරතබන්නාසේ.

කුන්තය=එනම් ආයුධය, හෙල්ලය.

දැගලෙකැළුසඳුන්සේ=අඹරන ගලක දැමූ සඳුන්මෙන්.

ඉස්බොල්ල=ගිනියම්කළ යකඩබෝල දමා විසිකරන ආයුධ විශෙෂයක්, හිස්කබලහෝවෙයි.

පාරාවළලු=හාත්පසින් කැපෙන යුධායුධයක්.

වජ්‍රායුධ=විදුරු ආයුධය; අතුනු=බඩවැල්.

ත්‍රිශූල=හුල්තුනකින්යුත් ආයුධය, ඊශ්වරයාගේ එනම් ආයුධය.

පොරෝදු=පිළියෙන් කළ උපකරණයක්.

**34 වන පිට. (31)**

දානපාරමිතා=දාන පිරීම් සඞ්ඛ්‍යාත පාරමිධර්මය.

ළතරවූහ=දැඩිවූහ, තදවූහ.

තුන්අග=ත්‍රිවිධඅඞගය. එනම්– සාධාරණ කමින් ලැබූ දෙය, තමන් ගැන නොබලා නොපසුබැසදීම, ශ්‍රද්ධා වෙන්දීම.

දෙඅඞග=අඞගදෙක, සතුටින් පිළිගැනීම හා එය වැළදීම.

කෙසරු නැම්ති=කෙශරවැනි, මල්රේණුවැනි.

**35 වන පිට. (31)**

දස්කම්=දැසකම්, මෙහෙකිරීම; මුවවිට=ගැටිය, මෝවිට.

ශිලපාරමිතාව=ශීලය පිරීම් සඞඛ්‍යාත පාරමිධර්මය.

අභිගුණ්ඨික=නයින් පාලනයකරන, නයින්නටවන.

පොළුනැගෙන කලක්මෙන්=ගෙඩි(ගඩු) නැගෙන කාලක්සේ.

මානසික දුකඛීන්ද්‍රියයක්=සිතට දුක් ඇතිකරන හෙතුවක්.

වාලධිය=වල්ගය, වල්ගාපත; කොල=බොල, එම්බා.

නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව= තපස්රක්‍ෂා කිරීම් සඞඛ්‍යාත පාරමි ධර්මය; අභිනිෂ්ක්‍රමානුගත පාරමිධර්මය.

වැසිකිළියක්=වර්චස්කුටියක්, කක්කුස්සියක්,

**36 වන පිට. (32)**

බල්‍යයෙහි=බාලසවභාවයෙහි, බාලවයසේ.

සමනක්=සවාමි පුරුෂයෙක්.

පහළ=පහර, ප්‍රහාරකළ.

ප්‍රඥාපාරමිතාව=නුවණ පිරීම් සඞඛ්‍යාත පාරමිධර්මය.

කෙළිකොළුසහයක්=උපකාරයට කොල්ලෙකු හෝ කොල් ලකුගෙන ඊමක්.

**37 වන පිට. (33)**

ජඩවූ=මෝඩවූ, තදමෝඩවූ.

කඩදත්මාල්ල=කැඩුණු දත්ඇති මහලු මිනිහෝ, වැටුණු දත්ඇති නාකියා.

අත්සුණු=අග්ගලා, සතනුහකන.

අතගුලෙන්=(අත්+අගුලෙන්) අතින් අරින වහන අගුලෙන්.

අඹුළු දූරිකතුන්=භාර්‍යාව වන ළපටි කානතාව.

අසබාදෙයක=නිශ්චයකොට නොහැකි කාරණයෙක.

සොරසාද කථාවකුත්=හොර මිත්‍රකථාවකුත්, සාද යනු මිත්‍ර බවයි.

ලකවැළක්=ජපමාලාවක්; පිළිකුඩයක්=රෙදි කුඩයක්.

මන්ත්‍රපොත=බ්‍රාහ්මණයන් විසින් යාගමන්ත්‍ර පිණිසගෙන යන පොතක්.

ගුළිපසිය=ගුළිදමන පසුම්බිය; කෙණ්ඩිය=කොතලය.

සකාත්=හක්ගෙඩියත්; අනුරූපවූ=සමානවූ, වූවමනාවූ.

එක්පට වහන් සගල=තනිපටක් ඇති සෙරෙප්පු කුට්ටම.

සූගක්කා=ටිකක්කා, ස්වල්පයක්කා

විෂඝොර=විෂයෙන් ඝොරවූ, නපුරු විෂඇති.

## 38 වන පිට. (34)

අනන්තාපරිමාණ=(අනන්ත+අපරිමාණ) කෙළවරක් නැත්තාවූ, අසංඛ්‍ය.

ඛම්ශුකාරි=යහපත්ලෙස යුක්තිය ඇතිකිරීම.

නළල=ලලාටය, නළල්ශබ්දය නිඩාලයන ප්‍රාකෘතශබ්දයෙන් භින්නයි.

සියොලඟ=සකල ශරීරය, සියලු අවයව.

සාධුකාරයෙන්=සාධු (යහපත)වේවා යන ශබ්දකරණයෙන්.

දෑඩමලූනූවූයේද?=අධික ඝොෂාවෙන් ඉවරයක් නූවූයේද.

ගෙට ගියහොත් අඹු මියෙහි මග ලැග්ග හොත් තෝමියෙහි=ගෙට ගියහොත් භාර්‍යාව නසන්නීය මාර්ගයෙහි නැවතුන හොත් තෝනසින්නෙහිය.*

අඹුසිහිත්ත=බොළඳ බිරිඳ, බාලවයසැති භාර්‍යාව.

මියන කාරණාව=මැරෙන හෙතුව.

පැන්බොත්නටයාදී=පැන්බොන්නට (යද්දී) ගිය අතර.

## 39 වන පිට. (35)

සිටිසේ සිටම=සිටිසැටියටම එතනම්සිට.

ඔල්වරහඬ=ප්‍රීතිඝොෂාව, සතුටුනාදය.

බැණවීය=කථාකෙළේය.

පසාරයෙන්=ආකාරයෙන්, සැටියෙන්.

නිවහල්බව=ඉතා දුක්පත්බව, උපකාරනැති බව.

රුහැණිව=කෝපව, විරුඩව.

දැළිපත=දෑථාව, රැවුල්පත, මහත්රැවුළ.

ළෙන් ඇවිල=පපුවෙන් ඇවිලී, හෘදයදැවී.

මියුඹුරු සුසුමක්ලා= සිහිල්ලීමක් හුල්ලා, මහත්සේ හුල්ලා යනුයි. මියුඹුරු යනුද හීල්ලීමට නමකි.

ආන ආනා=ඇනුම් ඇර ඇර.

---

* තොකීවෙයි තොකිය අපවත දෙය බමුණු අ ද
කොරුකෙයි බැමිණිගෙට ගිය මහ ලැග්ග තො ද

## 40 වන පිට.

මස්සෙන්දහස=මසුවලින් දහස, මස්සක් නම් පනම් හයක් ශත 32 ක් පමණ වටින මිල විශෙෂයෙකි.

සමාධිවූහ=සිත් එකඟකරගත්හ.

කලඟහට=කලඹුතු නිඳු, අපහාස.

අලුදෙරක්=හල දෙරක්, හලයන්ගේ හකාරයාගේ ලෝප යෙන් "අල" සිසිඹයි.

පැලුදෙර=පස්සාදෙර, ගෙවල පසුපැත්තේ පිහිටි දෙර.

## 41 වන පිට.

මණිමෙඛලා දෙව්දුව=එනම් දෙවතාවී, මණිමෙඛලා යන් නෙත් මැණික්මය මෙවුල්දැමය යන අළඟෙනදෙයි.

පරිභව නොවන්නේය=නින්දා නොවන්නේය.

(37)

මූදුබත්වූහ=මුහුදට ගොඩුරුවූහ, මුහුදේ ගිලී ගියහ.

දිව්පහස්=දිව්‍ය ස්පර්ශය.

පුස්රථය=කෙළි පිණිස ගෙනයන විචිත්‍රරථය.

ක්ෂාන්තිය=ඉවසීම, සතුරන්ට දඬුවම් කරන්ට ශක්තිය තිබී යදිත් එසේ නොකර සිටීම.

කලාබු රජ්ජුරුවන්= කාශ්මීර දෙශයේ රජ කළ රජෙක්.

අනාතංපුරවාසීන්=ඇතුළු නුවරවාසීන්, රාජසත්‍රීන්.

ඇකයේ=උකුලේ.

## 42 වන පිට.

කටුසැම්ටිය=කටුසහිත කසය.

ඒසා=ඒ සමාන; කම්කටුලක්=වධයක්; පීඩාවක්.

ඌනතාවක්=අඩුබවක්, පිරිහීමක්.

කම්බලයෙන්=බලවත් කර්මයෙන්, මහත් අකුශලයෙන්.

සත්‍යපාරමිතාව=සත්‍යය පිරීම සඞ්ඛ්‍යාත පාරමිධර්මය.

පුසනැකතින්=පුෂ්‍යනක්ෂත්‍රය, නකත් 27 න් 8 වනු නැකත.

සතාරහගාථා=සත්පුරුෂයන් සෙවනය කිරීමෙහි උතුම්බව භගවා කියනලද ගාථා පංක්තියක්.

## 43 වන පිට.

මඟුල්සලෙහි= මඞ්ගල්‍ය ශෛලයෙහි, රජු වාඩිලන ගලින් සෑදූ රාජාසනය.

දියදෙබෙකොට=ජලය විභෙදකොට, දිය භාගදෙකක්කර.

පෝරිසාද=එනම් සොරා, සුතසෝම බෝධිසත්වයෝ ~~ගෞතම සර්වඥයන් වහන්සේගේ කාලයේ සිටි භයානක චෞරයෙක්~~.
අස්වමින්=නමකියමින්, නමගෙනහැරපෑමින්.
ඇතැරුවෝ=ඇතුන්පිටයන්නෝ.
මිටිමියරපොල්ලක්=උසනැති මියර (නියර) ක්.
අත්බඹරක්=ක්‍රීඩාබඹරයක්, අතින්ගහන බඹරයක්.
එලකායුධ=පලිඟ, එලක=පෝරුව, පලිහ ලෑල්ලක්මෙන්වන හෙයින් එලකායුධය නම්.
කඳුළුපෙතකැයි=කඳුළුපොදකැයි; නොබාන=භයනොවන.
ලොකාතීත=ලොකය ඉක්මෙවූ, ලොකයෙහි අධිකවූ.

(39)

ආත්මප්‍රේමයකින්=තමාකෙරෙහිවූ ආදරයකින්.
සම්භවවීම්=පැමිණවීම, සම්බවීම්, සම්භවයයනු උපැත්මටද නම්.
සබාරසට=සත්‍යය නැමති රසයට.
පටුන්ගමට=පට්ටනමට, වෙළඳ ජනයන් වසන මූදුබඩගමට.
බිලියමට=බිල්ලට, බිලිවීමට.
බිමතුබූමළ=බිමතිබුණු (තුණු) අශුචි.

## 44 වන පිට.

ධර්මීන්=නහර.
මස්පලුහන්ට=මස්පුලුස්සන්ට; මස්බදින්ට.
අධිෂ්ඨාන පාරමිතාව=මෙසේවේවායි තරයේ සිතීම් සංඛ්‍යාත පාරමිධර්මය.
තේමියරජු= එනම් බොධිසත්ත්වරාජයාණෝ.
ජාතිස්මරණඥාන=පෙරවිසූ ජාතිසිහිකිරීමේ නුවණ, පූර්වනිවාසනුස්මෘතිඥානය.
නොගොළුව=ගොළුනොවීම; ගොළුවකුව නොසිටම.

(40)

ගොළුගතුව=ගොළුවෙක්සේ වෙව.
තුන්අඟ අධිෂ්ඨාන=ත්‍රිවිධ අධිෂ්ඨානය, එනම්– ස්වකී ශරීරයේ අවයවයන් විනාශවෙද්දී පවා සිතූ සිතීමත් වෙනස් නොකිරීම, දරුවන්ගේ ජීවිත ආදි බාහිර වස්තු විනාශවෙද්දී පවා සිතූ සිතීම වෙනස් නොකිරීම, ස්වකීය ජීවිතය විනාශයේදී පවා සිතූ සිතීම වෙනස්නොකිරීම යන මොව්හුයි.

## 45 වන පිට.

වක්කන්තෙන්=වක්කන්යනු කොටසට කියනමකි.
සිසිලස=සීතලය,
මුචලිඳුනම් නාගරාජයා=බුදුරජාණන් වහන්සේ බුදුවූ සත් සතියේ වැසිවස්නා සමයෙහිමේ නාරජුගේ භෝගාවලියේ මතුවැඩසිට පෙණගොබය යට ආවරණව වෙසෙමින් බණ දෙසූහ.

“සවන සතියැ වැසි වසිනා දස දිනෙ හි
පෙණීන සෙවෙණි මුදලිඳු නා දරණගෙ හි”

භෝගාවලිය=දරණවැල, දරණගෘහය.
මුබබාතේලා=තොණ්ඩුව කරෙහිදමා.
ධර්මතාය=ධර්මස්වභාවය, ධර්මය අනුරූපව පැවතීම.

(41)

නෘත්‍ය ගීත වාද්‍යයෙහි= නැටීම, ගී කීම, වැයීමෙහි.

## 46 වන පිට.

තම්ලුලිය=තමාලලතා, බුලත්වැල, තම්ලුයන්නෙන් කොල්ලන්ද කියවෙත්. නමුත් ඒ රුක් වෙසෙසෙකි.
කොඳ කැකුළ්=නුපුබුදු කුමුදුමල්.
ස්වර්ණහංස=රාජහංසයෝ, “රාජහංසාසතුතෙ චඤ්චුචරණෛර්ලොහිතෛස්සිතාඃ” යන මෙසින් රත්පා තුඩු හා පා ඇති සර්වාඞ්ග ධවලවූ හංසයන් රාජහංසයයි කියත්.
මනාසිඟුවලඟ=මනොඥවූ සිහින් ඉඟටිය, සිහින් ඉඟටියක් හා පළල් උරයක් ඇතිවීම ස්ත්‍රීන්ට ශොභාවක්වේ.
වසාරාජී=රෝම සමූහය, මවිල් සමූහය.
ලියවනයට=ලතාවනයට, ලිය නම් ලතාවනයට.
වලිත්‍රයක්=විලිතුනක්, රෙඛාතුනක්

“වන්නැබ වළ සිටුවමිනි වසාය ට
තුන්විලි මහ බඹු බැඳි වැනි සැරප ට”

ඇඹුල්මල්=කුමුදුමල්, ඕලුමල් හෝයි.
මිණිමෙවුල්දම=මැණික් ඔබ්බවා කරනලද මෙඛලාදම.
දෙවටොර=(දෙ+වට+උර) වටවූ දෙවුර; සඳග=පාදාභරණ විශෙෂයක්.
සලඹ=පයෙහි ලන වළලු විශෙෂයක්; වසිලඩී=පාවහන්, පාදාභරණ.

අවමඟුල් රථය= මළමිනිගෙන යන රථය.
දිවිහිමියට=ජීවිතාන්තයට, දිවිකෙළවරට.

47 වන පිට.

සිවුරුස්=හතරැස්, සම පැති සතරක් ඇති.

(41)

කසිරජ්ජුරුවෝ=කාශිදෙශයෙහි රජාණෝ, කසිරට උතුරු ඉන්දියාවේ මැදින් පිහිටි ජනපදයකි. බරණැස අගනුවරයි.
මල්කලඹක්=මල්පොකුරක්, මල්මිටියක්.
පිටල්ලෙන්=පිට දොරින්, පස්සා දොරෙන්.
සුපුෂ්පිත=මනාසේ පිපුණු, හොඳට පිපුණු.
කඹුරසමක්=මසින හමක්, ආචාරියාගේ ගිනි පිඹින හම.
පශ්චිමාන්තය=(පශ්චිම+අන්තය) පස්සා පැත්තේ කෙළවර.
වෙරහෙන්නම්=පොරට ඒනම්, පොරුබැඳුවේනම්.

48 වන පිට.

හෝවිල්යානාවක්= පැද්දෙන සයනයක්, උඤ්චිල්ලාවක් (හකාරලොපයෙන් ඕවිලියි සඩයි)
බඳුවදමල්=බන්ධුජීවකපුෂ්ප, සපත්තුමල්යයි මෙකල භාවිතා කෙරේ.
හුණුකැමැත=උෂ්ණය කැමති හොත් (හුණ=උණු).
පෙරතුව=පූර්ව, ඉස්සර.

(43)

දියෙන් ගැඹුරු=ජලයෙන් පිරුණු, අධිකජලයෙන් යුත්.
මෙහඬවනියක්=මෙහශබ්දයක්, අහසගෙරවීමක්.
සිත් පිත් නැති=සිතක් පිතක් නැති.
එරාවණ=එනම් ඇතා, ශක්‍රයාගේ හස්තියා, "අසිරාවන චූවත්නම් නරීසින් එන" එරාවණ හස්තියා සංග්‍රාම යෙහිද වීරයෙකි. බලවත් එකෙකි. එරාවන දිව්‍ය පුත්‍රයා ගත් හස්තිවෙශය.
කුරවිකනාදයක්=කොවුල් නාදයක්, කෝකිලයාගේ නාදය ඉතා මිහුරුයි කියති.

එයින් කීහ:- "කුරවීනාද වීර ස
කර වෙණ නාදට අපහ ස"

49 වන පිට.

බත්දෙන=ආහාරදෙන, තමාට ආහාරදී පොෂ්‍යකරන යනු අභිප්‍රායයි.

(44)

මිත්‍රද්‍රෝහි=මිත්‍රයන්ට ද්‍රෝහකරන්නා, මිත්‍රයන්ට අපරාධ කරන්නා.

ඌනතාවක්=අඩුකමක්, අසම්පූර්ණකමක්.

රන්කෙහෙල්ලියක්=ස්වර්ණකෙතුවක්, රත්රන් වැඩ කරන ලද කොඩියක්.

බුධකෘත්‍ය=බුදුකිස, බුදුවීම සඳහා කරනලද ක්‍රියා, පෙරුම් පිරිමාදිය.

රන්වන් මුවරජව=ස්වර්ණවර්ණ මුවරජව.

මුවදඩයමෙහි=මුවන් මැරීමෙහි, දඩ යනු වනයට හෝ ගම නට නම්.

ගිජුවගෙන=මහත් ලෙස ආශාවී.

විත්කන්නා=විනිවිඳයාම්.

## 50 වන පිට.

ශාඛා මුව රජ්ජුරුවෝ= උප මුවරජ්ජුරුවෝ, ආධාරකාර මුවරජ.

අභය=නිර්භය, කැමැත්ත, නිදහස.

දූරි ඇති=දරු ගර්භයක් ඇති, ගර්භිණිවූ.

මූකුරුවාගු=මේරුවාගු, වැඩුණුවූ.

අනින්දයින්=අනින්දැයින්, එයින් තුන්වන දවසින්.

දම්ගෙඩියෙහි=මස් කපනකොටයෙහි, හිස්සිඳින කොළොම් බුවෙහි.

තම තමන්ට සිතත්මුත්= තම තමුන්ගේ කාරණාගැන කල්පනා කරන නමුත්.

මරුකතර=වාලුකා කාන්තාරයෙහි.

ගැල්සාත්තුවක්=කරත්ත සමූහයක්.

සාත්තුවාහයෙකු=සමූහය ගෙනයන ප්‍රධානියකු.

## 51 වන පිට.

මාවුලාව=කොට්ටය, මෙත්තය.

මඤ්ජිදේවින්ගේ=මදුරජුගේ දූගේ;හස්පැටවුන්=හංසපැටියන්.

(46)

තනසඟල=පයොධර යුග්මය.

පරදුඃඛ=අන්‍යයන්ගේ දුකඃ අනුන්ට පැමිණි දුකඃ

පරිත්‍යාගකොට=තෑගිවශයෙන් දී; අත්හැර.

## 52 වන පිට.

උපෙක්‍ෂා පාරමිතාව= මධ්‍යස්ථතාව නැමති පාරමිතාධර්මය, සැප දුක් දෙකෙහි මධ්‍යස්ථතාව.

මිටි මුගුරු කැට=මිටි, පොලු, ගල්කැට; මුසුකල=මිශ්‍රකල, සංයොග කල.

කරයකින්= දළිපිහියකින්, පිහියකින්.

උපෙක්‍ෂාව=(උප+ඊක්‍ෂාව) මධ්‍යස්ථතාව, මැදහත්කම, සැප හා දුක ලැබෙන කල මධ්‍යස්ථව ඉවසීම.

කරපය මැසුව=කර හා පය එකට අල්ලා මැසීම, පාදදෙක හා බෙල්ල එකටතබා මැසීම; කුඹින්=කුඹස්ථාලයෙන්

## 53 වන පිට.

ගිනිසලා=ගිනි සුළි; ගිනිදැල් සමූහය.

පුළුන් පෙදක්සේ=පුළුන් පොදක්සේ; පුළුන් රළක්මෙන්.

සිවුරුකණකින්=සිවුරු කොනකින්.

සඳුන්පොඩිසේ=සඳුන් කුඩුසේ; කුඩා සඳුන් කැටමෙන්.

හුනුකලල්=හුනුමඩ; කලල්කරනලද හුනු.

කිළිල්කඩක්=වේබඩක්, ගසකබඩයක්.

පාරුවලල්ල=වසමාජිතිමාරයාගේ අනුහා සම්පන්න වලල් ලක ආකාර ඇති යුඩා යුධයක්.

සලාලාගැසීය=සොලවා ගැසීය; දෙස් කියවසී=සාක්‍ෂිකියවසී.

(48)

මණිකාන්තාව=මිණිකත; පොළොව නැමති සත්‍රිය.

## 54 වන පිට.

සිරිවස්පෙළ=ශ්‍රීවත්‍සස පංක්තිය, මඞගල්‍ය ලක්‍ෂණයෙන් යුත් විනිජ් විශෙෂයක්.

වල්විදුනාපෙළ=වාලවිනිජ පංක්තිය, චාමරපංක්තියක්. සෙම රුන්ගේ වාලධියෙන් තනාගත් පවන්පතක් පෙළ.

රන්අකුසුපෙළ=සවර්ණාඞකුස පංක්තිය.

රුවන්කලස්පෙළ=රත්නමය කලශෙඩිපෙළ.

රන්දදපෙළ=සවර්ණධවජ පංක්තිය.

රන්ඇගෑ=රත්තොරණ, සවර්ණාඞිකාව.

රුවන්මොරහු=රත්නමය යෂ්ඨි.

වියනෙක්=විතානයක්.

දිව්‍ය බ්‍රහම නාග සුපර්ණ ගරුඩ ගන්ධර්ව=දෙව් බඹු නා ගරුඩ ගුරුළු ගන්ධර්ව.

දිව්‍යනම්=ශක්‍ර ආදීහුයි. බ්‍රහ්මනම්=සහම්පතී ආදීහුයි.
නාගනම්=පාතාලවාසි නාගයෝයි.
සුපර්ණනම්= ශක්‍රභවනය ප්‍රවෙසම් කරන පිණ්ස මහමෙර පත්ලේ විතීය සීමාවේ මුරකරන දෙවතා විශෙෂයක්. මනාවූ පියාපත් ඇති හෙයින් සුපර්ණනම්. ගුරුළෝද සුපර්ණවර්ගයකි. ඔවුහු දෙපක්ෂයම නාගයන්ගේ සතුරෝවෙත්.
ගරුඩනම්=නාගයන් ගෙනයන ආක ශවාරිගුරුළෝයි; ගන්ධර්වයෝනම් සුපර්ණයන්මෙනම ශක්‍රපුරය රක්‍ෂත තවත් කොටසකි. ඔව්හු තුන්වන සීමාවේ මුරකරන ගායක පිරිසකි.

**55 වන පිට.**

පූර්වනිවාසානුස්මෘති ඥානය= පෙරිවිසූ කඳපිළිවෙල දන්නානුවණ.
දිවැස= (දිව+ඇස) දිව්‍ය චක්‍ෂුස.
ප්‍රතීත්‍යසමුත්පාදය=(ප්‍රතිත්‍ය+සමු+උත්පාදය) සහෙතුවාත්පත්තිය පිළිබඳව සොළොස් අඞගයකින් යුක්ත එනම් ධර්ම පටිපාටියයි
මහමෙරසා=මහමෙර සමාන.
අලළන්නාසේ=ආලොළනය (කැළඹීම) කරන්නාසේ.
උදන් අනාවදැර=ප්‍රීතිය ප්‍රකාශකොට වදාරා.
නවානු දහසක්=(නව+අනූ+දහසක්) අනූනව දහක්.
කුසින්=කච්ඡයෙන්, කිසිල්ලෙන්.

**56 වන පිට.**

නාබතල්කඳ=(නාඹතල්කඳවියයුතු) තරුණ තල්ගසේ කඳ, නාම්බන් තල්කඳ.
යමාමහපෙළහර=යමකමහා ප්‍රාතිහාර්යය, යමකයනු දෙකකට නමි. සර්වඥයන්ගේ ශරීරයෙන් නිකුත්කළ ගිනිහා ජලදෙක.

(50)

අතුවලතත්=අතුරලාතත්, විසිරලාතත්.
අභිධර්මපිටකය= 8 වෙනි පිටේ විස්තර බලනු.
නානානය වශයෙන්=නොයෙක් පිළිවල් වශයෙන්, නානාවිධ ක්‍රම වශයෙන්.
වියරුහුණුවාක් හුගේ=විකාර වැටුණ කෙනෙකුගේ.
තුන්මංසලෙක්හී=තුන්මන්සන්ධියෙක්හී.
අනන්තාපරියන්ත= (අනන්ත+අපරියන්ත) සීමාකළ නොහෙන අධික.
යදම්න්මසා=යකඩදම් වැලෙන්මහා, යකඩදම් වැලෙන්බැඳ,

## 57 වන පිට.

පොරෝදු බහන්=ගෙත්තම් සිත්කම් කළ කඩ.

මල්දම්සෝළු=මාලාදාම සාටක, මල්දමින් යුක්ත කරනලද සාළු.

නුරා=අනුරාගය, කාරුණ්‍යව.

ලැසිගත් ගමනින්=අයිහුවූ ගමනින්, අලස යන අළුයෙහ්ද ලැසි යනු වැටේ.



ලැසිගන්වමින්=අභිලාෂ ගන්වමින්, ප්‍රිය උපදවමින්.

මරාඞගනාවෝ=(මාර+අඞගනාවෝ) මාරසත්‍රිහු සිදුහත් කුමරු වන්ට බුදුවී නොදෙම්හයි. කාමයෙන් මත්කරනු වස් පැමිණි මාර දුහිතෘහු තිදෙන.

කනතට=(කන්+අතට) කනදෙසට.

නෙතුපුලෙන්=(නෙත්+උපුලෙන්) නෙත්‍ර නැමති මහනෙල් මලින්.

රසවතුන්= රසයෙහි ඇලුණුවුන්; කාමයෙහි ඇලුණු ඇත්තන්.

නිල්වරල්බා=නිල්වූ කෙශකලාපය හෙළාගෙන.

මේකුළු=මෙඝකූට; වැසි වලාකුල්.

දෙව්දුනු=දේදුන්න; ඉන්‍ද්‍රචාපය.

තඹුරුතඹරවන්=රත්පැහැයෙන් යුත් නෙළුම් මල්වැනි.

ලව්නාත=තොල්; වතල=පැතුරුණු, විහිදි; දසන්=දත්.

සඳවළාහී=සඞ්ඛවළාහයෙහි.

දළමුත්හරින්=දැඩි (මහත්) මුක්තාහාරයෙන්.

ලෙහිමලළලා=පපුයෙහි තොණ්ඩුවදමා.

ළඳබොළදබසන්=බාලවූ සත්‍රීන්ගේ මොළොක්වචනයෙන්; සුරතල් බසින් යනු අභිප්‍රායයි.

මුවසඳමඬල=මුහුණ නැමති චන්‍ද්‍රමණ්ඩලය.

සුදුරැස්කඳ=ශ්වෙතරශ්මිකදම්බ, සුදුරැස් සමූහය.

ජලවහනය වන=දියවැගිරෙන; දියගලාවැටෙන.

සඳකැන්=චන්‍ද්‍රකාන්තීන්, සඳරැස්.

උන්මාද=උන්මත්; විහිවිකල, පිස්සු හෝමූර්ච්ඡාවූ.

නිවනට අකුල්වූ= නිවන්යාමේ මගට අකුලක්ව; නිවනට බාදාවූ.

සසරට පිටුවහල්වූ=සංසාරයටපිටුවහල්වූ; සසරට උපකාරවූ.

සුවයට නිධානවූ=සැපයට නිධානයක් බඳුවූ, සැපත උපදින තැනක්වූ.

විළියෙන්=ලජ්ජාවෙන්; හිරියෙන්; ආර්ද්‍රකොට=තෙත්කොට.
පියුම්බී=මල් (පැණි) බී; මත්රදහසුන්=මත්වූ රාජහංසයන්.
පියරුව්=ප්‍රියරුවය හෝ ප්‍රකෘතිරුවයයි.
සල්මල්හි=ශාලපුෂ්පයෙහි; ඉඹුල් රුක්හි.
ගුගුරන=නාදකරන; අදළුගුම්=ප්‍රියනාදය, මිහිරිනාදය.
සුපුලඹෙහි=(සුපුල්+අඹෙහි) පිපුණුමල් ඇති අඹගසෙහි.
කෙවිල්ලන්ගේ=කෝකිලයන්ගේ.
මැදපිල්සත්= මධ්‍යම පිල් කුඩය; මැද පිහිටි පිල්කැටිය.
මධ්‍යම පිල් ඡත්‍රය.
බැහැවුම්ගත්=පෙරුත්තකරන.
කොකාගත්=(මොනර) නාදයගත්.
අඟින් යතයතා=අංවලින් උලඋලා, අංවලින් දවට දවටා.
මුවරළින්=මෘගරංචුවෙන්, මුවරංචුවෙන්.

## 58 වන පිට.

වසත් මුවපොල්ලන්=වසන්ත කාලයෙහි මෘගපොතකයන්.
ලියමඬුලු=ලතාමඬුළු, වැල් එකට බැඳී තිබෙන මඬුලු.
සුදොසුදු=සුදීන් පිරිසුදුවූ; හුනුගා පිරිසිදුකළ.

## 59 වන පිට.

සුදොසුදුවැලිතලා=සුදුපැහැයෙන් පිරිසුදුවූ, සමතලා වැලි බිම්.
රිදීපටබඳු=රිදීපටක්මෙන් (සුදු) රිදී වැළක්මෙන්.
මහගඟුල්හැලි=මහගංගා ඇළි, ඇල්ලක් නම් ගංගාවක් ගලා ගොස් පර්වතයකින්, ඇදහැළිමයි, නොහොත්කන්දකින් වෙගයෙන් ඇද හැළෙන නිර්ඣරයයි.
මල්මුවරදබර=පුෂ්පමකරන්දයෙන් බරවූ, මල්හි රෙණුයෙන් බරවූ.
ළපල්ලව=(ළ+පල්ලව) දළු, ළපටිකොළ.
මිහිරක්=රසයක්, මධුරතාවක්.
පනා=පානස; කොස්.
සිහිත්කෙන්ද=හීත්කෙන්ද; එනම් සුවඳ මල් පිපෙන ගස් විශෙෂයක්.
"සත්නන් සිහි ගෙඩි සෙවණලූ වැලි තෙලෙන"
ශිථිලකොට=පහසුකොට; මොළොක්කොට.

(52)

හිමසඳුන් පල්ලවයක්=ශීතල සඳුන් කොළයක්.

ළදසිව්මැලි=ළපටි මොළොක්, නොමේරූ සුදුපාටින් යුක්ත.

අපිස්කෙණෙකු=අලෙපච්ඡකෙණෙකු, මදක් සතුටු කෙණෙකු.

ළැමදදූළිදිය=පපුවේ මව්ල්වලින් වැගිරෙන දඩිය, පපුවෙන් වැගිරෙන දඩිය.

කෙවේරිය=පොරෝ විශෙෂයක්; වැරසිඳ-වීයඹයබිඳ.

කළුදෑකඩක්=කළුපාට ඇති දෑලාගියරෙදි කැබෙල්ලක්; දෑගිය කිලුටු රෙදිකඩක්.

සසිරි නොසිටුවා=වී පොතු නොතබා.

අකුරුවියැට= ගල්කැට විඇට.

බොල්පානු=ඝනවූ වතුර, මිටිකිරි.

දරළුදුලුවා=ලිපදරලා, ගිනිමොළවා.

බත්කොමු නොකොට=බත් අමුනොකර; බත් අඩක් පමණක් ඉදෙන්ට නොහැර.

දඹුගා=කුරුගා, ලීයෙන් යටිකුරු උඩුකුරුකර පෙරළා.

දෑගල්=අඹරනගල්, මිරිස්ගල්.

තලපත්=එනම් ධාන්‍යවල කොළ, තාලපත්‍ර.

මාලුඹරවා=මාලුඒදෑ, මාලුපිසවා.

අක්පතල=භාජනයේ පතුළ, තාච්චියේ අඩිය.

කරබෙඹිය=කරපිංච, මහාවේ=මහාවීථියේ, මහපාරේ.

බස්පමණකුත්=වචන පමණක්වත්, කථා කිරීමක්වත්.

59 වන පිට.

මියුඹුරු=මියඹුරු=ඈනීම, සුසුම්ලීම.

අතකරදී ඔසවා=අතින් කර අල්ලා උස්සා.

දෙරඅඩවළකොට=දොර අඩක්වසා, දොර හරියට නොවසා.

වණපොතැයි=පාඩම් ඇතැයි, මතක තිබෙයයි.

කූට්ටිනිවරු මුළක්=ප්‍රයොගකාර මහලු ස්ත්‍රීහු සමූහයක්, පණ යමට මගපෙන්වන මැලියන් රුසක්.

(53)

වඞගගිරියෙහි=වෙස්සන්තරරජතුමා තපස් රැකියාම දුෂ්කර වංගු සහිත මාර්ගයෙන් යුත් පර්වතය, කුටිල පර්වතය.

මද්‍රිදේවිය=මදුරජුගේ දූ, විස්වන්තර බිසව.

මූර්ච්ඡාවත්ම=සිහිනැතිවන අතර.

ඇකයෙහි=උකුලෙහි.

පිරිමැදිසේක=පරිමර්දනය කළසේක, අතගෑසේක.

පියුම්රජකල්හි=පද්මනම් රජකාලයෙහි, බෝසතාණෝ චුල්ලපද්ම කුමරුව ඉපිද වැඩි රජවූකල කොටකුට ලොබවූ බිසවුන් කරදමාගෙන යන්නාහු පිපාසාය වූකල උරහිස පළා ලේ පොවා පිපාසය සන්සිඳෙව්හ.

මල්බෑයන්=මලණුවන්, බාලසහෝදරයන්.

ඇවටිකමුත්=පෙරත්තයත්, බලවත් ඇයදීමත්.

මූඪවූ=මුළාවූ, මෝඩවූ.

හැම්මෙන්නේ=පිළිකුල් කරන්නේ.

නුඹුපුල්පෙති පරදවන=නිල්මානෙල් මල්පෙති පසු කරන (ඇස් සඟලයන්නට විශෙෂයි.)

දියඋල්ලක්සේ=දියඋඹලක්; දියඋල්පතක්.

කෙම්වැල=ඉදුණු කවුඩුකැකිරිගෙඩි, ඉදුනුකොවක්කාගෙඩි,

අදරපල්ලවය=තොල් නැමති පත්‍රය.

රෙද්දක්=රෙඩ්ඩක්, කපුකටින උපකරණයක්.

60 වන සිට.

සම්භූතවූකල=පහළවූකල, වූකල.

නන්දෙඩවන්නා කොටත්=කටට ආ ආ නිෂ්ඵල වචන කිය න්නා තරමවත්.

නුවන් බැල්මකට ලෙසිතෙනැත්තෝ=ඇසින් බැලීමට අලස තැනැත්තෝ.

ප්‍රෙමරසසුන්=ආදරය නැමති රසසිඳි.

සේවතගේ=දැසියකුගේ; පිරිවරසත්‍රියකුගේ.

(54)

ව්‍යාජයක්=රැවටිල්ලක්, මායාවක්.

විශ්‍රම්භනැති=ක්‍රීඩා පිණිස කලහ කිරීම නැති, අවිශ්වාස.

නොකැළි=කැළිනැත්තාවූ, කළුනැති.

නොඑලූ=එළලූ නැත්තාවූ, සුදුනැත්තාවූ.

නොදල නොසින්= දැඩිනොවන (මහත් නොවන) සින් නොවන.

පියාණන් මූණ දැලි පිසුම්හයි= පියාගේ මුහුණේ දැලි (කුණු) පිසුවම්හකියා. මෙහිදැලිශබ්දය දැකීකාළුයෙහි නොවේ.

වාසිබැණ=අපහාස වචන කියා බැණලා මෙහි "බැණ" ශබ්දය කුචිජි වචන කිමෙහි වැටේ.

## 61 වන පිට

කන්සයකට=කන්මුලපැත්තකට.
අක්කොණින්=ඇස්කොනින්; ඇස්කෙළවරින්.
නුරුලා බලමින්=රාගයෙන් බලමින්.
හත්පිළි=ඇඳිවසත.
ජරායෙන් පාරප්‍රාප්ත= මහලුකමින් කෙළවරට පැමිණි, දිරී මෙත් කෙළවරවූ.
විළිපිළිවූ=වලිත පලිතවූ, ඇගේ රැලිවැටීම හා හිසකෙස් පැසුණු.
ගුගුල්දෙන=දගලන, සෙලවෙන.
සවනසතිය=බුඩත්වය පැමිණීමෙන් පසු ගතකළ සත්සති යෙන් සවනසතියයි
මුචලිඳයට=එනම් කඳු ප්‍රදෙශයට.
මුචලිඳනාගරජයා=එනම් නාගරාජයා.

"සවන සතියැ වැසි වසිනා දස දිගෙ හි
පෙණින සෙවෙනි මුදලිඳු නා දරණ ගෙ හි".

භොගාවලියෙහි=දරණ ගොඩෙහි, දරණවැලෙහි.
නවනීල=අලුත්වූ නීල්.
නාලියදූවටුදඬු=බුලත්වැල් දඬු, බුලත් වැල් දැහැටි.
වණිපාරයන් දෙදෙනා=වෙළඳුන් දෙදෙනා.
මුංවන්=අරුණුවන්.
ශෛලමයපාත්‍ර=සෙලින් සැදූ පාත්‍රා, ගලින් සෑදූ පාත්‍ර.
බුත්සරණ=බුදුන් සරණ.
බහලවූව=බහලඋව=වැඩිවූව, මහත්වූව.
ආයාසය=වෙහෙස, පීඩා, ප්‍රියනොවේ.

(55)

ආළාරකාළාම උදකරාම– බුදුරජාණන් වහන්සේ බුදුවූ පසු පළමුකොට සඩර්මය දෙශනාකරන්ට අදහස් කළ බ්‍රාහ්මණයන්දෙදෙනා.
පස්වගමහණුන්=බරණැස් නුවර ඉසිපතනාරාමයෙහිදී ප්‍රථම කොටබණදෙසූ, අඤ්ඤාකොණ්ඩඤ්ඤ, මහානාම, භද්දිය වප්ප, අසජ්ජි, යන පස්නම.
ආජීවකයා= ශෛව සමයෙහි පූජකයෙක්, නිගණ්ඨ තාපස කොටසෙහි කෙනෙක්.

## 62 වන පිට.

අචල=සෙලනොවන, ස්ථිර.

මහදඹගස=උසමහතින් එක සමානහයි කියන මහරුක් පසින් එකක්වූ හිමාල වනයේ පිහිටියේයයි සම්මතවූ මහාදඹරුක; ජම්බුද්වීපයයන නාමය මේ ජම්බුගස හෙයින් ව්‍යවහාරවියයි කියත්.

හුණුහුණුතැනින්=වැටුණු වැටුණු තෙනින්.

දිව්දළින් ඔප් නැගූ=කොටිදතින් ඔපදැමූ.

ප්‍රකොටියක්=100,000,000,000,000,000 ක් නොහොත් කෝටියේ ඒවා සියක් දහක්.

අසංඛ්‍යයක්=ගණින් නැති ගණනක් නොහොත් මහාකඨාන සියක් දහහක්, අසඞ්ඛ්‍ය කල්පය යනු බලනු.

ගන්ධහස්තින්=ගන්ධකුලයෙහි ඇතා, සෙසු ඇතුන්ට සාධාරණ තෘණාදිය මේ ඇතුන්ගේ කුසෙහි දිරාගිය කල සිව්දෑ ගඳ වහනය වන සෙයින් ගන්ධහස්තිනම්.

විසිනිය කොපොල් බොල්-දෙ අසුන් සමතලාවූ

මොහොලති නෙඹිරුපූ නිරිඳු-සිය බිඳුනමෙ ගඳතනම්

සපඹාකරන= සමානකරන, සමානවන්ට තැත්කරන.

හිරමඬුමස=සූර්‍ය්‍යමණ්ඩලය සමාන.

හළුවනාදෑ=හැරියයුතුදෙය.

සිත්මන්=සිතේමානය. දළුදප්=දූඑඑඩිය.

## 63 වන පිට. (56)

සත්කුළපව්වන්=සප්තකූට පර්වතයන් (යුගන්ධරයනු බලනු).

ඉද්දක්=කපුකටින ඉද්දනම් උපකරණය.

බරලූ සමක්සේ=බරතැබූ හමක්මෙන්.

නාඹතල්කඳ සා=තරුණ තල්කඳ සමාන.

පොකුරුවැස්සෙන්=මල්වැස්සෙන්.

මඟුල්කළස=මඞ්ගල්‍ය කලස, අභිෂෙක කරන පැන්ලූ කළ ගෙඩිය.

උකාගෙන=උරාගෙන, පැහැරගෙන.

ඉස්නා=ඉසින්නාවූ.

අසුරයන්=සුරතුරෝ; ශක්‍රයාට සතුරෝ.

හිව්ගැවසි=අතුරු නැතුව සිටි, ඉහළුරැළිසිටි.

මාතලිදිව්‍යපුත්‍රයන්=චාතුර්මහාරාජ්‍යකවාසි දිව්‍යපුත්‍රයන්.

## 64 වන පිට (57)

අමානිවන්=අමෘතමහානිර්වාණය.

සුවාසූදහසක් ධර්මස්කන්ධයෝ=අසූහාරදහසක් ධර්මාවයව [වෙයි.

කුසිනාරානුවර=මල්ලව රාජ්‍යයෙහි ප්‍රධානනුවර.

ඒසල්රුක්දෙකමතුනොවෙයි=ඒසල්වෘක්ෂදෙක පමණක් නො

මංලෝලොඹු=(මල්+ඕලඹු) එල්ලෙන මල්සමූහය.

**65 වන පිට.**

ජාලාකවුළුවක්=දැලක්සේ සිදුරු සහිතව සාදනලද කවුළුවක්.

මුදුන් මල්කඩක්= මුදුන්මල් වඩමක්; මුදුනේපළඳින මල් වඩමක්.

මල්සුමුගක්=මල්කරඬුවක්.

බුමාටු දෙවතාවන්=භූම්‍යසථ දෙවතාවන්, පොළොව ආශ්‍රය කරමින් සිටින දෙවතාවන්.

තිඹක්=ද්‍රෝණයක්, ලාස් සතරක්, මාගධ භාෂාවෙන් තිඹට ලාස්සක්ද, සිංහලව්‍යවහාරයෙහි ලාස් 4 ක්ද වේ.

මහපත්කුඩසාපෙති=මහාපත්‍ර කුඩසමාන පෙති ඇති.

(58)

පෙත්තෙන්=මලෙහි පත්‍රයෙන්ද,

කෙසරුවෙන්ද=කෙශරයෙන්ද.

රෙහෙනුවෙන්ද=මලේ රේණුවෙන්ද.

කළුවැල්=කළුඅගිල්.

තුවරලා=ගුගුල්නම් සුගන්ධ විශෙෂය.

ගෝසිය සඳුන්=ගොශීර්ෂක චන්‍දනය; කළුතඹ වර්‍ණයෙන් යුත් මිශ්‍රිත සුවඳවත් සඳුන්, මේචන්‍දනය උත්පල සුගන්ධවත් බැව්කියත්. මෙහිආදි ශබ්දයෙන් ගොශීර්ෂක හරිචන්‍දන, තෛලපර්‍ණික යන සඳුන් වර්‍ගය කියත්.

හුදෙක් අහස් මතුනොවෙයි=තනිකර අහසපමක් නොවෙයි.

තත්සරනගා=වීණා තතින් හඬ උපදවා, තත්නම් වීණායෙහි ලනුයි.

වඩගීවීණා=එනම් තනි ශබ්දය නිකුත් කරන වීණා.

නකුලවීණා= තුන්තනින් හ්‍රස්ව දීර්‍ඝප්ලුත වශයෙන් ශබ්ද නිකුත් කරන වීණා.

භෘඞගවීණා=මීමැසි නදය වැනි රාශික නාදයක් නිකුත්කරන වීණා.

ගැටබෙර=කුඩාබෙර විශෙෂයක්.

පණාබෙර=දෙමළ බෙර විශෙෂයක්.

එකැස්බෙර=එකපැත්ත ගසන බෙරය.

මිහිඟුබෙර=මෘදඞගබෙර.

ලොහොබෙර=ලොහොයෙන් තැනූ බෙර.

තප්පු=රබන් විශෙෂයක්.

දිඝනිකායෙහි=දික්සඟියෙහී, සූත්‍රපිටකයට අයත් සඟීපසෙන් ප්‍රථමසඟීය. සෙසු සඟී නාම්– මැදුම්, සංයුත්, අංගුත්තර කුදුගොත් යන සඟී සතරයි.

### 66 වන පිට.

දෙවොරොහොණ= දෙව්ලොව නගින හිණ. දෙවොරොහොණ මඞගල්‍යයේදී දෙවියන් මැවූ රුවන් හිණ.

යමහළ=මරණ මඤචක භූමිය.

සිංහශය්‍යාව=සිංහරාජයකුගේ නිදිමවැනි උත්තමවූ නිදිම, වම් කකුල පිට දකුණුපයතබා දකුණු ඇළයෙන් නිදිම.

විජම්දෙසන්ට=අභිධර්මය දෙශනාකරන්ට.

(59)

හළුවූල=හැරීයාලු.

පන්සියපනස් ජාතකයන්=බොධිසත්ත්වයන්ගේ ඉපදීම් පන් සිය පනස.

චුද්‍දසබුඩඥනය=චතුර්දශ බුඩඥනය යනු බලනු.

ඉතිපිසොභගවා=මෙසේ ඒභාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ.

නවඅරහාදි බුදුගුණ=අරහත් ආදි නවවිධ බුඩ ගුණයන්.

අරහං=අභීත් නම් වනසේක; සම්මාබුඩො=සම්‍යක් සම්බුඩ නම් වනසේක; විජ්ජාචරණ සම්පන්නො=විජ්ජාචරණ සම්පන්න නම් වනසේක; සුගතො=සුගත නම් වන සේක;ලොකවිදූ=ලොකවිදූනම්වනසේක;අනුත්තරො=අනුත්තරනම් වනසේක; පුරිසදම්මසාරථි=පුරිසදම්ම සාරථි නම් වනසේක; සත්ථා=ශාස්තෘනම් වනසේක; දෙවමනුස්සානම්=දෙව්මනුෂ්‍ය නම් වනසේක.

### 67 වන පිට.

ශතරාව=සියක්වර නාදය.

සහස්‍රාව=දහස්වර නාදය.

අමාමෑණියන්වහන්සේ=අමෘත දානයෙහි මෑණියාණකෙනෙකුසේවූ හෙයින් අමාමෑණියන්යයි කියනලදී.

අප්‍රමාද විහාරයෙන්=නොපමා හැසිරීමෙන්.

සත්දහතළා=හිමාලවනයෙහි පිහිටි රථාකාරවිල, මන්‍දකිනි විල, හංසපාතවිල, අනවතප්තවිල, ෂඩ්දන්තවිල, කුණාලවිල, කණ්ණමුණ්ඩ විල යන සත.

සියක්වර පොළාදූ=සියසැරයක් පෙළු, සියවරක් ශුඩකළ.

ආදහන=පිලිස්සීම, මෘතශරීර පිළිස්සීම.

(60)

වාරිමාගී=වතුරගලා යන කාණු, ඇළවල්.
රන්දෙණිහි=රනින්කළ තුම්බයෙහි.
පිධානයකින්=වැස්මකින්, පියනකින්.

### 68 වන පිට.

කුලූපග=මිත්‍ර, යහළු, හිතවැඩ ඇති.
රන්තල්වැට=සවර්ණමය විජනීපත්‍රා, රන්තාලවෘන්ත.

### 69 වන පිට. (61)

ආයුෂමත්වූ=ආයුෂ ඇත්තාවූ; ගරුකටයුතුවූ.
අභිඥාපාදකකොට=අභිඥාව මුල්කොට ඇති පඤ්චාභිඥා යනු
බලනු.
චතුර්ථධ්‍යානය=සතරවන ධ්‍යානය; සුඛඑකාග්‍රතා යන දෙක
පමණක් පවතින ධ්‍යානය.
අනාවරනඥානය=අන්‍යකුට මුව හා කළනොහැකිඥානය.
ගොප්මස=වළලුකරසේ මස.
ගණනායක=පැවිද්දන්ට නායක.

### 70 වන පිට. (61)

සංස්කාරධර්මයෝ=සංඛාරධම්ම, සත්ත්වද්‍රව්‍ය යන මොවුන්හට
ගැනීම් සම්බන්ධ පැවතුම්.

(62)

ජවි=සිවිය, සම; විසතිර්ණී=පැතිරීම, විහිදීම.
සතර දළද=දන්තධාතු සතර.
අකුධාතූන්=උරහිස් ධාතූන්, උර ඇටධාතු.
උණිහිස=නළල, නිඩාලය.
අබඇටසාසේක=අබඇට සමානසේක.
අත්කරසා=අතේ ගොබය සමාන.

### 71 වන පිට.

නගුලිස්=(නගුල්+ඉස්) නගුලේ හිස්.
උදකධාරා=ජලධාරා, වැහෙන දියකඳන්.
දිවාණිවටසේ=පළිඟු බුබුල්සේ.

(63)

සන්ථාගාරය=විශ්‍රාම ශාලාව, රැස්වීම් ශාලාව.
සිව්දගඳ=චතුර්ද්‍රව්‍ය ගන්ධය, කුංකුම, තුවරලා තුරුක්තෙල්
යවන පුෂ්ප යන සුගන්ධ සතර.

පූර්ණඝට=පූර්ණකලස්, මල් ආදියෙන් පිරුණු කළගෙඩි.

දාකෙළි=ධාතුපූජා, ධාතුපූජායෙන් කරන උත්සව, එම උත්සව ක්‍රීඩා;

රත්නපර්‍ය්‍යඞ්කයෙහි=රුවන්පලඟෙහි.

ඇත්කුඩ පහරවා=හස්තිකුම්භයපිසවා, ඇත්කුඹය ගාවා.

දුනුමුඩාවෙන්=දුන්දුභිසෙන්, දුන්නේමුඳුනෙන්.

## 72 වන පිට.

සාසිකවූ=කෝපවූ; යුද්ධක්ෂමවූ=යුද්ධයෙහි දක්ෂවූ; යුද්ධයෙහි ආශාඇතිවූ.

(64)

සිවුරඟසෙනඟ=චතුරඞ්ගණී සෙනාව, ඇත්, අස්, රිය, පාබල සෙනඟ.

චතුමධුර= සිවුමිහුර මී, ගිතෙල්, සීනි, මිදී යන සතර වර්ග යෙන් සෑදූ.

ශාක්‍යසිංහවූ= ශාක්‍යවංශයට ශ්‍රෙෂ්ඨවූ, ශාක්‍යවංශය නම් සූර්‍ය්‍යවංශයෙන් පැවති වංශයකි. අම්බට්ඨ ඔක්කාක රජු ගෙන් පටන්ගත් වංශයශාක්‍ය වංශයනම්විය. පූජාවලි යෙන් විස්තරදතයුතු.

ජබාදු=සුවඳ විශෙෂයක්, කස්තුරි සුගන්ධයක්.

කරතලය=හස්තතලය, අත්ල.

## 74 වන පිට.

වියරුභූණු=පිස්සු වැටුණු.

සොලොස් දහසක් නාටක ස්ත්‍රීන්=දහසය දහක් නටන ගැහැනුන්, දහසය දහක් පිරිවර ස්ත්‍රීන්.

දිවුණ දිවුණ=විගුණ කරමින්, දිගුණුවමින්.

සබවසරක=සත්‍ය වචනය රක්ෂාකර.

සැදෑහැතියන්=ශ්‍රද්ධාවතුන්, භක්ති ඇත්තන්.

(65)

කායබල දශයකින්=ශරීරයේ පිහිටි හස්තිබල දශයකින්, බුදුරජාණන් වහන්සේට තිබුණු ඡද්දන්ත (විලෙහි) ඇතුන් දසදෙනෙකුගේ ශක්තිය.

ඥනබලදශයකින්= බුදුරජාණන් වහන්සේ කෙරෙහි තිබූ ඥනබල දශයෙන්; එනම්:– ඨාන ඨාන ඥනය (විය යුතු නොවිය යුතුදේ දන්නා නුවණ) විපාක ඥනය කර්‍මවිපාක දන්නා ඥනය) සබ්බත්‍ථගාමිණී ඥනය

(සත්ත්වයන්ගේ ගමන් දන්නා ඥානය) අනෙක ධාතු ඥානය (ධාතූන්ගේ විශෙෂය දන්නා ඥානය) අධිමුක්ති ඥානය (සත්ත්වයන්ගේ සංසන්‍දන හෙවත් ඇළීම දන්නා ඥානය) ඉන්‍ද්‍රිය පරොපරියත්ත ඥානය (ඉන්‍ද්‍රිය පිළිවෙළ දන්නා ඥානය) ධ්‍යානාදිසංකිලෙසාදි ඥානය (ධ්‍යානාදීන්ගේ කෙලෙස් පිරිසුදුවීම් දන්නා ඥානය) යන සතද ත්‍රිවිධ විද්‍යාවද යන දශය.

(66)

පත්ලියන්නාවූ= ලියුම් ලියන්නාවූ.

රාමග්‍රාමයෙහි=රාමනම්ගමෙහි.

කෝලිය රජදරුවෝ=කොළොම්ගසදී උපන් රජදරුවන්ගේ වංශයයි. රාමරජුගේ හා ප්‍රියා බිසවගේ දරුපරම්පරාව.

විචරතැන=විතර තන්හි.

සත්රජදරුවෝ=රජවරු සත්කොටස.

මෛත්‍රියට නිවාසවූ= මෛත්‍රිය වසනස්ථානයක්වූ; ප්‍රෙමයට ගෙයක්වූ.

ප්‍රඥාවට වලලහවූ=නුවණට පිරිමියක්වූ, නුවණට ස්වාමියෙක් හෙවත් පණ්ඩිතයෙක්වූ.

## 76 වන පිට.

තොටකට=තීර්ථයකට, නැව් නවත්වන තැනකට.

පාධාවාරියට=හිමියෙක් නැතුවගිය, අනාථභාවයට ගිය.

වන්තාටය=වන දෙයකාටය.

මානයෙන්භජනය කරන්නාහුය=උඩගු කමින් ආශ්‍රය කරත් නෝය.

අනන්තාපරියන්ත= (අනන්ත+අපරියන්ත) කෙළවරක් නැති අසමානවූ.

අරාගී=රාගය නැති, කෙලශ නොමැති.

අවෙෂී=වෙෂයෙන් තොර, වෙෂ නැති.

අමොහිවූ=මොහයෙන් දුරුවූ, මුළානොවන.

ග්‍රන්ථපන්සියයක් විචර=පොත් පන්සියයක් පමණ, බැඳිම් පන් සියයක් විතර.

ද්‍රොණ ගර්ජනා=එනම් ගිගිරීම, එනම් නාදය, ද්‍රොණ නම් බමුණු ධාතු බෙදන අස්ථාවෙහි කළ නාදය.

දෙබණවරින්=බණ කියන දෙවාරයෙන්.

**77 වන පිට. (68)**

සක්පල් නාරද=සංඛපාල නම් බොධිසත්ත්ව නාගරාජයා.

ප්‍රහාරාදිය=(ප්‍රහාර+ආදිය) පහරදීම, බැණීම ආදිය.

පස් ඇසක්=පඤ්චාක්ෂියක්, පසැස නම් :- ප්‍රකෘති ඇස නම්වූ මසැස, දිවැස, නැණැස, බුදුඇස, සමතැස යන පසක් ඇසී.

ළෙයින්=හෘදයෙන්, පපුයෙන්, මහත්ශොකයෙන්.

මගධනැළියෙන්= මගධරට ව්‍යවහාර කරන නැළියෙන්, ලාසෙන් හතරෙන් පංගුවක් නැළියයි; මගධනැළියක් මෙරට නැලි හතරක ප්‍රමාණයි.

**78 වන පිට. (69)**

සිළුමිණිසෑයෙහි= ශිඛා මාණික්‍ය චෛත්‍යයෙහි.

පිපළුලි=එනම් නගරය.

උකටලී නොවන පිණිස= කලකිරෙන පිණිස, අලස නොවන පිණිස.

අඬයටි මැදුරෙන්=අඬයටි නම් ආයුධ විශෙෂයෙන් යුත් රක්ෂ ස්ථානයෙන්.

ගව්මානයේ=ගව්ප්‍රමාණයේ ගව්වයනු ගවයන්මිදීමේ ප්‍රමාණ දූරය යන අර්ථයෙන් සෑදුණු ශබ්දයෙකි. .

**79 වන පිට.**

සැදැනැති=ශ්‍රද්ධානොමැති, විශ්වාසය නැති.

(70)

මාරභයඞ්කරයක් හා සමාන= මාරයන්ගේ භය උපදවන්නක් මෙන්.

උම්මත්තක රූපද=සිහිවිකල ශරීරද.

**80 වන පිට.**

තෙසූ=ඉතිරි, අනික් සත්රජනු.

(71)

**දශඨූපකථා නිමි.**

ථූපදශය සම්බන්ධ කථා අවසානයි.

---

තීර්ථකයන්=ශෛවදෘෂ්ටික පූජකයන්.

ධාතුනිධානයේ=ධාතුතැන්පත් කොට තැබීමේ.

## 81 වන පිට.

මහසුප් මහතෙරසාමි=මහාකාශ්‍යප මහාස්ථවිර ස්වාමි,
ලොහොපටක්=ලොහයෙන් කළ ඇතිරිල්ලක්.
දළුකරඬු=විශාල කරඬු.

## 82 වන පිට. (72)

සතරමහානිධානය=මහානිධානසතර, සංඛය, එලය, කුමුදය පුණ්ඩරීකය යන සතර.
සනාතුසිත දිව්‍යපුත්‍රයන්=තුෂිත නම් දිව්‍යලොකයෙහි වසන දිව්‍යයන්.

(73)

දැඟිගුලෙන්=ජාතිහිංගුලින්, සාදිලිංගම් වලින්.
පිළිල්ල=පිළ, කුඩාපිළ, අභ්‍යන්තර ගෘහයට යාව පිහිටි කොටසයි.
අස්රෙද්දේ=යතුරේ, යතුරු මුඳුවේ.
කෙසියතුරු මුඳු=කෙසිනම් යන්ත්‍ර මුද්ද, යතුරු හා මුඳු.

## 83 වන පිට.

ව්‍යාලරූප යුක්ත= ව්‍යාඝ්‍රාදි නපුරු සත්ත්වයන්ගේ රූපයෙන් යුක්ත ව්‍යාඝ්‍ර සිංහ සර්පාදීන්ගේ රූපයන් ගෙන් යුක්ත.
කර්මානුරූපව=කළ අකුශල් කුශල් කර්මයට අනුව.
බින්දුසාර=ධර්මාශොක රජුගේ පියරජු.
එකාතපත්‍ර=(එක+ආත+පත්‍ර) එක කුඩය, එක කොඩිය.
රාජසෘඩි=රාජමහිමයෙන්, රාජබලයෙන්.

## 84 වන පිට. (77)

ත්‍රිපිටකධාරී=තුන්පිටක ධර්මය උගත්, තුන්පිටකයෙහි උගත් කම ධරන
නාගලතා=බුලත්වැල්. ඇඹුල=නෙල්ලි, ඔළු.
දිවපාන=දිව්‍යපානය; සියදෑහැල්=සියක් දවසින් පැසෙන වී.
නවදෑසක්යාළ=යාල් නවදහසක්, යාළනම් අමුණු විස්සකි.
බඩහලා=භාණ්ඩාගාරයෙහි.
පුරවිකෙවිල්ලෝ=පරපුටු කෝකිලයෝ.

## 85 වන පිට.

කෙලශපරිනිර්වාණකොට=කෙලෙස් නිමවා, කෙලෙස් සිඳ.
මෛත්‍රෙය සර්වඥයන් වහන්සේට=මතුබුදුවෙන මෛත්‍රියනම් බුදුවරජාණන් වහන්සේට.

(75)

රත්හැකිල්ලක්=රත්රන් විලංගුවක්.

තුලනාකරත්=සමාන කෙරෙත්.

සද්ධර්මචක්‍රවර්ත්තිවූ=සද්ධර්මනැමති චක්‍රය පවත්වන්නාවූ උතුමා, සර්වඥයන් වහන්සේ.

අසූ අනූ ව්‍යඤ්ජනයෙන්= දෙතිස්මහා පුරුෂ ලක්ෂණයන්ට අනුව පිහිටි අසූවක් පමණ කුඩාලක්ෂණයෙන්.

නවහම්=නවාම්, නවකර්මාන්ත.

## 86 වන පිට.

පරසක්වල=පිටසක්වල, අන්‍යචක්‍රවාටවල.
සිඳුරකල්කයට=රතුඊයම් වලින් සාදන කල්කයකට.
පද්මරාග මාණික්‍යයට=රතු මැණිකට, රතුකැටයකට.
සරත්වළා=ශරත් කාලයෙහි වලාහක.
සාළාවැටූප්=ජටාසූළි පැවතුම් ඇති.

(76)

මද ටවන්=මාඤ්ජෂ්ඨවර්ණය, රක්තවර්ණයට හුරුවර්ණය.

රතිඳුගොව්සේ=වර්ෂාකාලයෙහිදී පොළොවෙන් පැන නගින කෘමියකුසේ. රූ බදුල්ලා නම් කෘමියාසේ.

සපනකුට පර්වතය=සූගඳුරු යනු බලනු.
පබසර රස්කඳෙන්=ප්‍රභාස්වර රශ්මිකන්ධයෙන්.
කූටාගාර=කුළුගෙවල්.
උණකුළලින්=උණලී නළාවෙන්.

## 87 වන පිට.

අසඞ්ඛ්‍යතවූ=සංඛ්‍යාවත් නැති.

සිවුමැඳුරු කවුළුව=උඩුමහල්තලවල සාදනලද සිංහපඤ්ජර නම්වූ කවුළුවක්.

පණ්ඩරඞ්ග පරිබ්‍රාජක=(පණ්ඩර+අඞ්ග) සුදුරෙදි පෙරවී පරිබ්‍රාජක කොටසක්.

හද්‍රපීඨ=උතුම් පුටු, රාජසයන්.

මොරපුටු=මධ්‍යම තරමේ පුටු, මයුර පිල්කලඹක්සේ සාදන ලද හාංසිපුටු.

බාඤ්ඤ හොඤ්ඤ=කන බොනදේ.

(77)

සගමහළු=බාල මහලු, තරුණ හා මහලු.

අනාචාරිච=සිරිත් පිළිවෙත් නැතුව.
සන්තානයෙහි=සිතෙහි, සිත්පිළිවෙළේ.
ගුණලවයෙක්=සවල්පගුණයක්, ගුණමාත්‍රාවක්.
ඉරියා පථයෙන්=(සතර) ඉරියව්වෙන්.
උපාධ්‍යායයන් වහන්සේ= ගුරුවරයාණන් වහන්සේ, උපසම්පදාකර්මය කළ ආචාර්යභික්ෂූන් වහන්සේ.
වත්පිළිවෙත්=උපස්ථාන පිළිවෙත්.

(78)

වික්ෂෙපවූ=කලබලවූ, චඤ්චලවූ.
පස්ගුණය=ප්‍රත්‍යක්ෂගුණය.

## 89 වන පිට.

බෑණෝය=සහොදරයාණෝය.
අපිත් සතොස්=අල්පේච්ඡ සන්තොෂය, ලද පමණින් සතුටුවන.

(79)

සාමණේර= (සමණ+ඒර) ශ්‍රමණ පුත්‍රයා, උපසම්පදා නූවූ මහණහු.

## 90 වන පිට.

එකලෙසයක්=එක ප්‍රමාණයක්. එක් අඞ්ගයක්.
දම්පියායෙහි=දම්පියා නම් ග්‍රන්ථයෙහි.
අප්‍රමාද වර්ගයෙන්=අප්පමාදො අමතපදං යනාදියෙන්.
බූවබත් කෙනෙකුන්=හැමදම පවරා බත්දෙන කෙනෙකුන්.
පාසාණ්ඩයන්ට= බ්‍රාහ්මණ දෘෂ්ටියෙහි උගන්වනලද පරිදි නොකරනකුට පූජකයන්ට.
චතුර්විධ ප්‍රත්‍යයෙන්=සිවුපසයෙන්. [ලබනු.
අඞ්ගයෙන් නවයෙක=අඞ්ගවශයෙන් නවයකි නාවඞ්ග යනු
ස්කන්ධයෙන් සූවාසූ දහසෙක=ස්කන්ධවශයෙන් 84000 කි.

## 91 වන පිට. (80)

අසෝතෙනයයි=අසවල් තැනයයි.
පොලූපොලූව=කැබෙලි කැබෙලිව.

## 92 වන පිට.

බිලියම්කරවා=බලි කර්මය කරවා, බලිපූජාකර.
අනතරායක් නහමක් කෙරෙත්වා=අනතුරක් නොකරේවා.

(81)

චාරිකාවෙහි=සක්මන් කරන ශාලාවෙහි, සක්මනෙහි.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



### 93 වන පිට.

පිටතුයයි=පිටයයි, පිටවී සිටියයි.

ප්‍රත්‍යය දායකය=ආධාර දෙන්නෙක.

(82)

සඞ්ගීතිවයට=සංගීතිදෙකට, සංගායනාදෙකට (නැඟී) නැගූ.

අට්ඨකථා=විස්තර කථා, අටඨකථා.

### 94 වන පිට.

ථේරවාදයන්=ස්ථවිර කියමන්, තෙරුන්ගේ කියමන්. මහලුන් ගේ කියමන්, උපසම්පදාවී දසවර්ෂයක්ගිය භික්ෂු ථෙරනම්.

තිලකාළසේක=ඨානානතරයට නියම කාළසේක, නියමකාළ සේක.

ගන්ධාරරට=නන්දහාර් ප්‍රදෙශයට, මෙකල අෆ්ඝනිස්ථාන් රටේ කොටසක්.

වනවාසිදෙශය–හිමවත් ප්‍රදෙශයට, නේපාල, බූතාන දෙරට.

අපරන්තරටට= (අපර+අන්ත) බස්නාහිර කෙළවර පිහිටි රටක්. අවන්ති රට.

මහිසමණ්ඩලය=දඹදිව පළාතක්.

මහරටට=මහාරාෂ්ට්‍රික රාජ්‍යයට, මැරැටින්ගේ රටට.

යොන්රටට=යෝනකදෙශයට, ඉන්දියාවේසාගලපුරය පිහිටි ප්‍රදෙශය,

සුවණ්ණභූමියට=රන්බිමට,බුරුමයට නුදුරුවපිහිටි සධූන්පළාත.

සෘඞ්ධිවිහාරිකාවූ=සෘඞ්ධිමහිමයෙන් හැසිරෙන්නාවූ.

(83)

මහලුරජනු හැරගෙන=මහලුරජු අරගෙන.

### 95 වන පිට.

යථාභිරතියෙන්= (යථා+අභිරතියෙන්) අභිරතිය ලෙස, අභි රතිය නම් සිතේ ආශාවයි.

ළමන්දුන්දෑ=මෑණියන් වහන්සේ, මවුවහන්දෑ.

පඤ්චරාජක කුධභාණ්ඩ=සේසත, මගුල් කඩුව, රත්නදාමය, මිරිවැඩිසගළය, වල්විදුනා යන පස.

මූලනැකත=නකත් 27 න් 17 වන නැකත.

වෙතීයවිහාරය=වෙදිස විහාරය මිහිඳුමාතෙරුන් වහන්සේගේ මෑණියන්ගේ වෙතිසනම් නාමයෙන් කරනලද විහාරය.

සැගිරිපව්ව=සැගිරි පර්වතය, චෛතියගිරි පර්වතය, මිහින් තලාව.

(84)

මකුළුහුයක්=මකුළුවකු අඳින නූලක්.

යටිපිටින්ද, උඩුපිටින් කළුවන් නොවනතුරු= යටිපැත්තෙන් දමා උඩුපිටෙන් කළුපාට වෙන්ට ප්‍රථම, මෙයින් ඒ රහතුන්ගේ ගමනෙහි ශීඝ්‍රතාවය දැක්වූහ.

**96 වන පිට.**

ජිනාභින්නපටධර=සිඳ බිඳ ගත්නාලද වස්ත්‍ර ධැරූ.

කාෂායවස්ත්‍රවක්=කහපාට සිවුරු.

තුන්උණයටෙක්=උණයෂ්ටිතුනෙක්.

ලතායෂ්ටිනම=ලියයටි නමය, වැළින් යුක්ත දණ්ඩය.

සකුණයෂ්ටිනම= ලිහිණියටිනමය, සකුණ නම් කොස්වාදි ලිහිණියි.

විභාගකරනලද=වෙන්කරනලද, වෙනස්ව පිහිටි.

ජීවංජීවකයෝ=චකොර විශෙෂයක්, ඇටිකුකුළෝ.

**97 වන පිට.** (85)

සාරථියාට=රථාචාර්‍යයාට, අස්ගොව්වාට.

ආර්‍යයෝ–උත්තමයෝ, රහතුන් වහන්සේ, ගුරුවරයාණෝ.

කොඳුපලස්=කොඳුවලින් සැදූ කම්බිලි.

**98 වන පිට.**

ප්‍රණීත කැඳ අවුළු=රසවත්වූ කැඳ හා ව්‍යඤ්ජනාදිය.

මාහිමියෝ=මහාස්වාමිහු, සංඝනායක ස්වාමිහු.

ප්‍රෙතවත්=ප්‍රෙතවස්තුව; විමන්වත්, විමාන වස්තුව.

සත්‍යසංයුක්තබණ=සත්‍යවූබැඳිම් ඇතිබණ, චතුරාර්‍ය සත්‍යයට අයත් බණ.

ඔල්වරහඬ=ප්‍රීතිඝොෂා, ප්‍රීතිහඬ, හුරේගැසීම.

පිළිදුගුම්කොට=ප්‍රතිජගගනය කොට, පොෂණය කොට.

දෙවදූතසූත්‍රය=දෙවදූතනම් සූත්‍රය.

සම්බාධයයි=පටුයයි, විශාල මඳයයි.

නාදුනුයන=(නාදුන්+උයන 'ශක්‍රයාගේ එනම් උයන.

ආශිවිෂොපමසූත්‍රය=(ආශිර්+විෂ+උපමාසූත්‍රය)එනම් සූත්‍රය.

රන්කුණ්ඩිකාව=රන්කෙණ්ඩිය.

අනවතග්ගීය=අක්මුල්නැති.

අග්ගික්ඛන්ධොපම සූත්‍රයෙන්=(අග්ගික්ඛන්ධ+උපම) සූත්‍රය. ගිනි කඳකට උපමාකොට දක්වූකාරණය.

**99 වන පිට.** (87)

වස්විසුවමනා=වස්විසීම වූවමනා, වස්විසීමට සුදුසු, වස්විසීම නම් වර්‍ෂාකාලයෙහි විසීමයි.

අටසැටලෙනක්=ගල්ලෙන් හැට අටක්.

කටාරකොටා= ගල්ගුහා ඇතුළට වතුර නොඑන පිණිස ලිස්තර පටියක්සේ කොටන කෙටීම.

කළුවැලිපියා=කළුවැලිහැර.

පේව=පෙහෙව, සිල්සමාදන්වී.

**100 වන පිට.** (88)

අකුදෑණින්=උරහිස් ධාතුව.

**101 වන පිට.**

තොලබෝවිතක්=තොලබෝ සිවියෙන් සෑදූ ඔඩමක්.

(89)

පොකුරුවැස්ස=මල්වැහි.

කාහලශබ්දයෙන්=නළාබඳයෙන්. වස්දඬුනාදයෙන්.

ප්‍රහෙදවසතූ=වසතුවෙන් කරන, ද්‍රව්‍යයන් බෙදන යන අළුයි.

ජලසාටිකාව=නානකඩය, නානවිට අඳින රෙද්ද.

**102 වන පිට.**

බෙර ඇසක්=බෙරයේ සමබැඳි පාර්‍ශ්වය.

වළල්කුට=අව්වෙන් වියළිගිය මැටිකැට.

වළල්පැළීගියේය=මැටි ඉරිතලා ගියේය, මඩ වෙළී පැළී ගියේය.

ඇත්කුඩවිචරට=හස්තිකුම්භය පමණට උසැතිව.

(90)

තලව්ව=සමතාලව.

ප්‍රාතිහාර්‍ය=පෙරහැර, ආශ්චර්‍ය්‍ය.

**103 වන පිට.**

මිනිසත්බව=මනුෂ්‍ය සත්ත්වභාවය.

සාධුජනයන්ගේ=සත්පුරුෂයන්ගේ; පණ්ඩිතයන්ගේ.

**ථූපාරාමකථාව නිමි.**

---

එසමයෙහි=ඒකාලයෙහි.

තෙරණිකෙනෙක්=(තෙර+අණි)මෙහෙණි කෙනෙක්.

## 104 වන පිට. (91)

ජම්බුකොළුනම් පටුන් ගම=දඹකොළුනම් තොට, පටුනු ගමක් නම් මුහුදුබඩ පිහිටි වෙළඳ ගමකි.

රන්දදපතාක= සුවණ්ණධවජපතාක, රන්කම්කළ කොඩි හා තුන්හුලස් කොඩි.

කාහලනාදයෙන්=නළාහඬින්.

## 105 වන පිට. (92)

දඟරගල්වා වැද=ශරීරය බිම අතුරුවා වැඳ, ශරීරය බිම හොවා වැඳලා.

සත්‍යක්‍රියා=ප්‍රාණනාබලය ප්‍රමුඛකොට තමාකරන හෝ කියන දෙය සිදුවේවායි කරන අධිෂ්ඨානය.

රුවන්තෙල්ලක්=රුවනින්කළ තෙලිකූරක්, රන්පින්සලයක්.

විමතියක්=අසමාහිභාවයක්, අස්ථිරතාවක්.

විඣාටවි= (විඣ්‍ය+අටවි) විඣ්‍යපර්වතාසන්න මහාවනය, විඣ්‍යවනය.

තාමලිංගමුතොට= තාමලිංගම් නම් (බ්‍රාහ්මණ) නිඑග්‍රාමය එනම් නැව්තොට.

දඹුළුතොට=දඹකොළතොට; මල්ඇගෑ=මල්තොරන්.

## 106 වන පිට. (93)

සොළොස්ජාතිසමපන්න කුලවාසීන්=දහසය ගොත්‍රයකින්යුත් කුලීනයන්.

රාජොද්‍යානයෙහි= (රාජ+උද්‍යාන) රජයාගේ උයනෙහි, මඟුල් උයනෙහි.

### බොධිආගමන කථානිමි.

බොධි ශාඛාව ගෙනඊමේ කථා සමාප්තයි.

---

## 107 වන පිට. (94)

පොහොගෙයක්=පෝය ගෙයක්.

ශිලාසථම්භයන්=(ශිලා+සථම්භයන්) ගල්කණු.

### යොජන ථූපකථා නිමි.

යොදුනක් පාසා සාදනලද දාගැප් කථා සමාප්තයි.

---

## 108 වන පිට.

අස්නැවියකුගේ= අශ්වනාවියකුගේ, අශ්වසෙනාපතියකුගේ.

සොළීරට්=සොළීදේශය, තන්ජාඋර් යන නාමයෙන් මෙකල ප්‍රකට ප්‍රදේශය.

(95)

---

## දුටුගැමුණු රජුගේ පිළිවෙළ කථායි.

සරස්නාවැව=වළස් නම් වැව.
සුළුගෙයි=කුඩාගෙයි; දෙවන රජමාළිගාවෙයි.
සිඹයිලා=විෂයොදා, වසනබා.
නෑජිකල=නැවාට පසු, ජලස්නානය කළවිට.
කාවන්තිස්ස=කාකවණ්ණතිස්ස, මේරජතුම අධික කළුපාටින් යුක්ත හෙයින් මේ නාමය වියයි සිතිය හැකියි.
විහාර මහාදේවි= විහාරකරවූ තොට සමීපයෙහිදී සම්බවූ හෙයින්ද අග්‍රමෙහෙසින් හෙයින්ද විහාර මහායන නාමවය විය.

### 109 වන පිට.

සංවාසයක්=සමගිවාසයක්, ස්ත්‍රී සෙවනයක්.

(96)

නුවණනැති කම්කළ=මෝඩක්‍රියාකළ.
ගනුවයි=අල්ලා ගනුවයි, මරවයි.
මුහුද උත්පාතිකකොට=මූද ඉතිරීමකොට, මුහුද ගලායාමට සලස්වා; සැළුහිඳුවා=ඔරුවේලා.

### 110 වන පිට.

කෙවුළෝ= කෙවතීකයෝ, මස්මරන්නෝ, ජලයෙන් ජීවිකාව කරන්නෝ, සත්=කුඩය.

(97)

ප්‍රතිපත්තියට දිවිදුන්නාවූ=(බුඩ) ප්‍රතිපත්තිනිසා දිවිදුන්නාවූ, ධර්මප්‍රතිපත්ති නිසා ජීවිතය ගතකරන්නාවූ.
අෂ්ටාර්‍ය්‍ය පුද්ගල=(අෂ්ට+ආර්‍ය්‍ය+පුද්ගල) සෝවාන් ආදි සතර මග සතර ඵලයට පැමිණි උතුම් පුද්ගලවූ.
මිනිසත්බව=මනුෂ්‍ය සත්ත්වභාවය, මිනිස්කම.
ප්‍රතික්කුලයයි=පිළිකුල්ය කියා.
අතපාරවා=අතපිසදමා.

### 111 වන පිට.

නිරුඩව=මැරී, චුතව.

(98)

නිමිත්තපාඨකයන්=නිමිතිදන්නෝ,නෛමිත්තක යනුබලනු.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



දැවුන්පැන්=සේදූජලය, බොවනයකළ ජලය.

දසඑකඩමසින්= (දස+එක+අඩමසින්) මසකින් අඩක් අඩු දශමාසය, මාසනවයමාර, දරුවකු බිහිවීමට සාමාන්‍යයෙන් ගතවන කාලය, පිළිසිඳ ගත්දැසිට දවස් 288 ක් පමණයි.

### 112 වන පිට.

ගොළුමුහුද= ශෝෂඝීක සමුද්‍රය, රළුවේගය අඩු නිසා මේ නම දී තිබේයයි සිතිහැකි.

මීපටලයක්=මීවැදැල්ලක්, මීවද(සමූහ)යක්.

මාලුනැවෙක=පරණ ඔරුවක, පරණ නැව් කඳක.

අසසලයා=අස්ගොව්වා.

කොළඹසමීපයේ=කොළඹනම් ගම සමීපයේ අනුරාධපුරයට්ත් තම්මැන්නාවටත් අතර විහිටි ගමක්.

සූරෙක්=සමතෙක්; සූරයෙක්.

අඹාදිවිය=ලුහුබඳවාදිවීය.

### 113 වන පිට. (99)

බිළිවැද්දෙක්=මස්මරන්නෙක්, බිලිබාන්නෙක්, සතුන් අල්ලා මරන්නාටද විදින්නාටද වැදියයි කියනු ලැබේ. බිලිවැද්දෙක් යන්නෙන් බිලිබාන මස්මරන්නෙක් යන අළුය ගෙනදේ.

දෙමළුන්සාබා=දෙමළුන් නසා, බත්ආලෝප, බත්පිඩු.

### 114 වන පිට. (100)

දිව්වකවච්=දිව්රූකවච්.

නිහඬුරු සුසුම්ලා=නිහඬුරු යනුද සුසුම්ලා යනුද එකාළුයි, බොහෝසේ හුල්ලා.

හසතිශිල්ප=ඇතුන් විහිදවීමේ ශිල්පය.

ධනුශ්ශිල්පය=(ධනුර්+ශිල්පය) විදීම.

නඩිමිත්‍ර (250)= නඬිමිත්‍ර වරපට බිඳිනලද හෙයින් මේ තෙමේ නඩිමිත්‍ර නම් විය, නඩි, නඩි * යනු සම් පටියට කියන නමයි.

ගොඨඉඹර= ගොටසිම්බර = ගොඨ=මිටි, ඉඹර = ඉඹුරුනම් තෘණ විශෙෂය.

### 115 වන පිට. (101)

කියවි=කරනදෙය, විසින්=නිසා, හෙයින් කරණවිභක්ත්‍යාළු නිපාතපදයක්.

---

* නඬි යනු කිසිපොතක පෙතෙකත් ඒ සඳෙස් පාඨයි.

කිසඅස්පස්කරති=ශරීර කෘතිය කරති, මලපහරති.
බිලිසේහෙලා=උඩබලියාවට සිටිනසේ තබා.

**116 වන පිට. (102)**

පවත්කෙරෙම්දූසි=පැවැත්ම කරම්දූසි, ප්‍රතිෂ්ඨාප ණයකරම්ද කියා.

කොලෙඹියක්හුගේ= පවුලේ ප්‍රධානියකුගේ, ධනවතෙකුගේ ගම් ප්‍රධානියකුගේ.

**117 වන පිට.**

කිස්දෙවුන්=කුසපිසි තැනැත්තා, බාලයා, බඩපිස්සා.
ගෙයින් දෙරට නොයි=ගේ ඇතුලෙන් මිදුලට නොයි, දෙර ශබ්දයෙන් මිදුල කියවෙයි.

"නිති ගේ දෙර ඇම ද
කැළිකසල දැක නොම හි ද"

වාරමණ්ඩලනම්ගම=දෙරමඩල නම් ගම.

**118 වන පිට. (103)**

පිළිසගලක්=රෙදි දෙකක්, වසත්‍රදෙකක්.
ප්‍රසාද=තෑගග, තෑගි.

(104)

සෞරවිසී=ශූරවීසිය, බියසුලුනොවනවීරිය, දක්‍ෂවීසිය.
කොරතල්=කුඩාතල්ගස්.

**119 වන පිට.**

ගිරුවාහෝබඩ=ගිරුවානම් ඔයබඩ.
හස්පරිහවකියා= විහිළුවට නින්‍දාවචනකියා කාවට වචනින් අපහාසකොට.
මාසව=මස්කලව, මහව.
කිරියක්=ක්‍රියාවක්, අමුණු සතරක් වැපිරෙන ප්‍රමාණයක්.

(105)

කඳවැටබඳලා=දඹුවැට බැඳලා, ලීයෙන් වැටබැඳ.
කෙළිපෙදවටිසේ= ක්‍රීඩා පන්දුසේ, සෙල්ලම් කරන පන්දු බෝලසේ.

**120 වන පිට.**

සගදැව=යකඩින් කළගදැව, යකඩමුගුර.
ජවයෙන්=දිවීමෙන්; දිවීමේ ශක්තියෙන්.

(106)

ගිරිනිල්දනව්ව=කතානියම නම් ජනපදය.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



### 121 වන පිට.

සෛන්ධවයෙක්, සිඳුරට උපන් අසෙක්, ජවසම්පන්න අශ්වයෙක්.

දව=ධාවනය, දිවීම.

ආගමකාවක්=පැකිලීමක්; තැතිගැන්මක්.

අඤ්ජනිපව්ව=නකුල්ගල නම් ග්‍රාමය.

බඤ්ජදෙව=කොරදේවයා යනාඑයි.

තුතුකෙරෙයි=කෑලි කෑලි කෙරෙයි.

චිත්තපර්වතය=සිතුල්පව්ව.

### 122 වන පිට. (107)

ශබ්දවෙධියා=විද්දයුතුසත්‍ව ඇසින් නොදැක ශබ්දානුසාරයෙන් විදින්නා.

සොළසගුල්බොල පියාපෝරු=අඟල් දහසයක් ඝනකම ඇති මොර (පියාල) ලෑලි.

බොලයවටද=ඝනකම ඇති යකඩද.

සුවඳුල්=සුගන්ධශාලි, එනම් වීවගීය.

### 123 වන පිට.

බුද්ධාන්තරයකින් යට=(බුද්ධ+අන්තරයකින්) බුදුකෙනෙකුන්ගේ කාලයෙන් යට, කල්ප ලක්‍ෂකිපයකින් යට.

වල්කල=රුක්පොතු, රුක් සුඹුළු.

හැල්කල=හෙමන්තකාලය, ශීතකාලය.

(108)

එකාවැළ= එකාවලිය, මුතුමැණික් ආදිය අමුනාකරනලද එකාංශමාලය.

දෙගත්හු= පූනනූලක්මෙන් පළඳින නූල් දෙපටකින් යුත් පළඳනාව.

කටිසූත්‍රය=කටිසජ්ජනය, ඉගපටිය.

රුවන්තනපට=රත්නමය පයොධරපට්ටය, තනසගල එක්කොට බඳින හෝ අඳින රන්කම් කළ සැට්ටය, චෝලිය.

රනහැකිළිගසා සොමුත්=රන්විලංගු දමා බැඳලා මිසක්.

### 124 වන පිට.

සුසැට ඔටුන්නක්=කොටස් සැටහතරක් අන්තර්ගත ඔටුන්නක්.

හස්කරවා=හෂ්මකරවා, අලුකරවා.

මගුල්හල= මඞ්ගල්‍යශාලාව, රජු හා ඇමතියන් රැස්වන මන්ත්‍රණශාලාව; මගුල් මඩුව, ඔටුනු පලඳින ශාලාව.

(109)

නෑකුළුකමෙක්=නෑ සම්බන්ධකමක්, නෑයෙක්ය, කුලයට අයිති කෙනෙක්ය යන අදහසක්.

යුදගනපිටියේදී=එනම් ග්‍රාමය, චූලගනපිටියයි මහාවංශයේ පෙනේ.

සපතකළ විසින්=පළකළ විසින්=දිවුරුම් දුන්නිසා, පොරොන්දුවූනිසා.

මියවැගිරගියාහ=මැරී වැටී ගියාහ, මැරීහොත්හ.

සෙව්කසෙව්කව=වහා වහා, ඉක්මන්ව ඉක්මන්ව.

**125 වන පිට.**

පෙරවිසනනාහය=පොරවාගෙන සිටි යුධ ඇඳුම.

(110)

සුඹුළුවක්කොට=දරණුවක්සේ වළයාකාරයක් කොට තබා; සුඹුලු ශබ්දයෙන් රුක්පොතුද කියත්.

**126 වන පිට.**

තෝමරය=දමාගසන ආයුධයක්, ලංසයක්.

(111)

පටහැණිව=විරුඩව, සතුරෙක්ව.

**127 වන පිට.**

කුලදේවතාවූ=කුලදෙවියන්වූ, පවුලේ අදහන දෙවියන්වූ.

හිණිහිස=පඩිපෙළ මුදුනේ; හිණිමග මුදුන.

**128 වන පිට.** (112)

රන්, රත්රන්=සුවර්ණය හා ශුඩකළ සුවර්ණය, ශුඩ නොකළ රන් හා ශුඩකළ රන්.

පටකඩ=පටරෙදි, පටවස්ත්‍ර, පිළිකඩ, සමාන රෙදි.

ජයකුනාතය=ජයකොන්තය, රජුගේ අතේ තබාගන්නා කඩුවක් වැනි රාජාභරණයක්.

බලකායෙන්=බලවත් සෙනා සමූහයෙන්.

වහල්වන්නෝ=පිහිට වන්නෝ.

**129 වන පිට.**

පච්චෙටෝලි=එනම් සැට්ට විශෙෂය, එනම් ඇඳුම් විශෙෂය.

(113)

මිසුගුණු=මහීයඞගණ.

මාවැලිගංබිත්තියේ=මහවැලිගංඉවුරෙහි.

සන්නිපාතස්ථානයට=රැස්වූස්ථානයට, එකතුවූතැනට.

තෙජොකසිණසමාපත්තිය= ගින්න කෙරෙහි සිත අරමුණු කොට ධ්‍යානයට වැදීම, ගින්න නිමිත්තකොට ගෙන කරන භාවනාවට වැද. කසිණයෝ දශයකි, ඔව්හු නම් :— පඨවි, ආපො, තෙජො, වායො, නීල, පීත, ලොහිත, ඔදාත, ආකාශ, ආලොක යන දශහුවෙත්. කසිණ යන්නෙන් භාවනානුයොගී යොගාවචර(භික්ෂූහු) විසින් යොදාගත්න භාවන මණ්ඩලය කියවෙයි.

**130 වන පිට.**

අප්‍රතිපුද්ගලවූ=ඊට වැඩි පුද්ගලයෙක් නැත්තාවූ, දෙවන කෙනෙකු නැති.

(114)

රන්සුමුගකින්=රන්කරඬුවකින්.

දම්සෙනෙවි=ධර්මසෙනාපති, ධර්මයට ප්‍රධාන තිලලත්.

මේවන් පහණින්=මෙඝවර්ණ පාෂාණයෙන්, කළු හෝ නිල් හෝ පාටින් යුත් ගලින්, මිනිරනින් හෝ වෙයි.

කසුන්=කාඤ්චන, රත්රන්.

**මියුගුණු දාගැබ් කථා නිමි.**

---

**131 වන පිට.** (115)

එලකාලුඛද=පළිහද; නුවරසාධා=නුවරනසා.

**132 වන පිට.**

ඩෞරසින්නම් සෙල්වූහ=ඩෞරසින්නම් නම් නළා විශෙෂය ශබ්දකරවූහ.

වඩබාමුවෙන්=වඩබාග්නිමුඛයෙන්,ඞඩබාගින්නනම් දක්ෂිණ) සාගරයේ නගින්නාවූ ගින්නයි.

අනුරාදෙවමින්=අනුරාග දෙවමින්.

තතනවමින්=කම්පාකරවමින්, කෙඳිරිගාවමින්.

සේයායට=සෙවණැල්ලයට.

පලාපුම්නිදලගඅවුණුවා=පලනාලද මිනි දත් අග අවුණා.

ගෙරීමිමූන්=එළුහරක් මීහරක්.

(116)

උක්කුටුකයෙන්=අධොමුඛයෙන්,පස්සාපාශ්වය,බිමසිටිනසේ.

දකුණත්සව්=දක්‍ෂිණ අතේ ශ්‍රාවකයා, මහා(ප්‍රධාන)ශ්‍රාවකයා, අග්‍රශ්‍රාවකයා, යනු තේරුමයි.

(122)

මලමිරිස් පැස්සක්=මලමිරිස් ගුලියක්, ලුණුමිරිස් සම්ලපයක්.

පිළිසඹඩම්=රෙදිමිටි.

**141 වන පිට.** (123)

ළපතිකාඩෙකා=තුනිරෙද්දක.

මාළිගාසැලැස්මක්=මාළිගා සටහනක්.

**142 වන පිට.** (124)

හිගුලෙන්=හිගුල්වලින්, සාදිලිංගම් යුෂින්.

වෙදිකාවෙහි=සතරැස් පිළේ.

නාරිවාහන=සත්‍රීන් විසින් උසුලන සත්‍රී වහන.

පිටාවුවක්=පියනක්, මුදුනක්.

මුත්තෙන්=මුතුවෙන්, මුතුවලින්.

ප්‍රසාදවහවූ=ප්‍රීතිය උපදවන්නාවූ, සතුට ගෙනදෙන්නාවූ.

රන්ලිය=සවර්ණලතා, රනින් කරනලද ලියවැල්.

බුමුතුරුණු=පලස්;

**143 වන පිට.**

පියගැටද=පඩිපෙළද,

(123)

අටමගල=කොත්අටකින් යුත් පඤ්ජරය, ශුනියම් කැපීමේදී ව්‍යවහාර කරන උපකරණයක්.

**144 වන පිට.**

රසමසවුල්=රසමස් හා ව්‍යඤ්ජන.

පරම්පරාවෙන් ගොස්=ක්‍රමයෙන් ගොස්; මනාසිදගොස්.

(126)

ගෝවෙසක්=ගවවෙෂයක්; ගොනෙකුගේ රූපයක්, ගෝන වෙෂයත්යයි කිසිවෙක් කියත්.

තුන්යාළසාරඅමුණක්=තුන්යළක් හා අමුණු හතරක්; අමුණු හැටහතරක්.

**145 වන පිට.**

වනපාරයෙක්=වෙළෙන්දෙක්,

(127)

ගැලක්සා=ගැලක් සමාන; විලිකුත්බව= දිණුබව.

**146 වන පිට.**

පාතුපිරිගියේය=මිදුළු පිරීගියේය.

(128)

ඇඹුලපක්සාමුතු=ඹිලුඇටසමාන මුතු.

### 153 වන පිට. (133)

අභිමඞ්ගලයයි=උත්තම මඟුලය කියා.

බොලඇති=ඝනකම ඇති.

### 154 වන පිට. (134)

දහසක්නයින්=දහසක් න්‍යායයෙන්, ක්‍රම දහසකින්.

බෙරවාසගම්=බෙරප්‍රවෘත්ති, අණබෙර ආරඤ්චිය.

අලුහ=ඇරියාහ;

### 156 වන පිට.

අඬෝනාකම්=විලාපකර්මය; බලවත්ලෙස කරන ඉල්ලීම.

ආගන්තුගසේක= පිටතින් පැමිණිසේක, අමුතුකෙනෙක් වූසේක.

නෙවාසික=නිවාසයෙහි පන්සැල රඳන, එහිම්පදිංචිවසිටින

මාලුබලතකු=වයස්ගත මූරකාරයකු, මහළුවූ මෙහෙකරුවකු.

### 157 වන පිට.

කුළුපග=යාළු, මිත්‍ර; දිගබොලපළල=දිගද,ඝනකමද,පළලද.

වියළාපළහා=වේලා පුළුස්සා.

පාත්‍රපයිසෙ=පාත්‍රය ලන කොෂයෙ,පාත්‍රයලන ඔලොග්ගුවේ

### 158 වන පිට.

අසෝගමයයි=අසවල් ගමය කියා.

තෙල්කුලාවක්=තෙල්බඳුනක්, තෙල්පිරූ අගක්.

පත්කුඩයක්=තාලපත්‍රාදියමකින් කළ කුඩයක්.

### 159 වන පිට. (168)

අසාධාරණවූ=සමානකළ නොහැකි, අන්‍යයකුට සමාන නොවන.

### 160 වන පිට. (139)

පියවසා=ඇගැබ්වටේ ඇති මල් පූජාකරන ශාලාව.

සුසවිරවනපිණිස=මනාසෙ පිහිටන පිණිස, මනාසේ සවිවන පිණිස.

ගලාපිසේක=ගිලාබැස්සහ.

### 161 වන පිට. (140)

පිධානයකරනු පිණිස=වසන පියනක් කරනු සඳහා.

සිරිවස=ශ්‍රිවත්සය, විෂ්ණුගේළයේ පිහිටි සුදුවන් ලොම්ගුළිය එනම් මගුල්ලකුණ.

කඳුසාබාව=ශාකාස්කන්ධය; අතුකඳන්.

රන්රසුදැල්=සවර්ණ කිඞ්කිණිකජාලා, රන්ගෙජ්ජි බැඳි දැල්.

රන්මිණි පනතියක්= රනින් කළ කුඩා ඝණ්ටාපෙළක්, රනින් සෑදූ මිණිගෙඩි පෙළක්.

නකත්කරුද=නක්ෂත්‍රතාරකාද, අස්විද ආදි තාරකාද.

කිණිබල්ලන්=දඬගම් බල්ලන්, නපුරු බල්ලන්.

(144)

ස්වප්නවීමංසා=හීනය විසඳ, සිනය විස්තරකර.

**166 වන පිට,**

පකාපැක් බාගන්නා දෙවිල්ලද= ,ඉදුණුගෙඩි කඩාගන්නා කෙක්කද, දෙවිල්ල යනු දෙබලයි.

දෙහින්නන්=සහෝදරයන් දෙදෙන.

රුප්පා=(රුක්+පා) ගස්මුල; හැළුලුණාවූ=කැළඹුණාවූ.

සිසන්න=සිහිය, සිහිකල්පනාව.

**167 වන පිට.** (145)

උදකධාරා=ජලධාරා.

උවිතවූ=සුදුසුවූ, යොග්‍යවූ; ජරාරූපා, මහලුරූ දිරුශරීර.

ව්‍යාධිරූප=ලෙඩින් යුත් මනුෂ්‍ය රූපය; මෘතරූප=මළශරීර.

**168 වන පිට.**

පවීතවජායෙහි=(පවීත+ජායායෙහි) කඳු සෙවණේ.

(146)

තන්තිරිආලවත්ති=වීණා නළා විශෙෂ.

දුහුල් පියල්ල=කෙඳිවලින් සෑදූ පහන් තිරය.

**169 වන පිට.**

දෑකුසෙහි=ධාතුගර්භයෙහි, දාගැබ ඇතුලෙහි.

(147)

විදුරුලිය=විදුරුවැල්, දියමන්ති එල්ලූ වැල්.

වැලිකොන්ද=දාගැබේ කොත පටන් ගන්න තැන, බුබුලා කාර ඉහළකොටස පටන්ගන්නා තැන.

ජවනිකා=තිර; සඳුන් කලල්=සඳුන් මඩ.

**170 වන පිට.**

දියදූරුඳ=දිය විහිදීම, වතුර ඉසීම. [මිදුල.

සලපතල මළුවෙහි=දාගැබ වට මළුව, නොහොත් ගල්ඇතුරූ

ගොප්මසැ=බත්කෙණ්ඩයෙහි මස්වල, කෙණ්ඩමාංසයෙහි.

ජාලාපැද්රූ=දැල් අශූරු පැදුරු.

(148)

තුලාභාර වස්තු=තමා බරට කිරාදෙන වස්තු, තරාදියෙහි එක පැත්තක අන් ලබන්නා සිටවා අනිත් පැත්ත රන් රුවන් දමාකිරා දෙන පිළිවෙල.

පිරිවනාශබ්දයක්=කියනාහඬක්; පාඩම් කරනාහඬක්.

**171 වන පිට.**

එක් දෙශමාත්‍රයක්=ස්වල්පමාත්‍රයක්, මඳ ප්‍රමාණයක්.

නියාමකරූනම්=ප්‍රධාන රූපය නම්වේ; නායකරූපය නම්වේ.

**172 වන පිට.** (149)

සමචතුරස්‍රය=හරිහතරැස්ය.

වන්ද්‍යාභිමාන=ගරුබවයෙන් වැන්ද යුතුවූ, වන්දනීයවූ.
පඤ්චනිකායික=නිකාය පසට අයිති.

**184 වන පිට.**

රත්පුබුසේසත=රත්රන් කුඩුම්බියකින් යුත් සුදු කුඩය.
සුවණ්ණභිංකාරය=රන්කෙණ්ඩිය.

(160)

චාතුපාරිශුද්ධිශීල නැමති අදර= චතුර්පාරිශුද්ධිශීල නැමති "කුඩේබෝස්ගෙඩි"ය ඇති.

සමාධිනැමතිදඬුඇති=පැහැදීම, නැමතිදණ්ඩක්(කඳක්)ඇති.

වීසතින්ද්‍රිය නැමති ගෝනැස්=විංශති ඉන්ද්‍රිය නැමති කුඩ නාණ (පරාල) ඇති. ඉන්ද්‍රිය විස්සනම්–පඤ්චෙන්ද්‍රිය, හා මනින්ද්‍රිය, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතෙන්ද්‍රියා සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොම්නසින්ද්‍රිය, දොම්නසින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය සන්ද්‍රියය, වීරයින්ද්‍රියය යන ආදියයි.

දසබල නැමති පෙති පෙළ=බල දසය නැමති පත්‍ර පංක්ති ඇති, හෙවත් කුඩපෙති ඇති.

මාර්ගඵල නැමති පත් සෙවෙනි = සතර මාර්ගඵල නැමති පත්‍ර සෙවිල්ල (කුඩරෙද්ද) ඇති.

විමුක්ති නැමති උතුම් ඡත්‍ර=සසරදුකින් මිදීම නැමති උතුම් කුඩය.

සද්ධර්මනැමතිරත්නචක්‍රය=බුද්ධභාෂිත දෙශනා නැමති රුවන් සක (රෝදය)

එකූනනුසියක්=(එක්+ඌන+අනුසියයක්) 8999 ක්.

**185 වන පිට.**

බ්‍යාමප්‍රභා කෙතුමාලාකාරයෙන්=බඹයක් පමණ ප්‍රභායෙන් යුක්ත තරකා රුස්වළල්ලක ආකාරයෙන්.

(161)

සිවුදූගඳින්=චතුර්ජාත සුගන්ධයෙන්, කොකුම් යවනපුෂ්ප, තුවරලා, තුරුක්මල් යන සතර.

**186 වන පිට.** (162)

නාරාචයෙන්=නාරාසනයෙන්, යකඩඉන්නෙන්.

සප්තමහවිල්= හිමාලවනයෙහි පිහිටි මහවිල් සත. ඔව්හු නම්–අනොතප්තය, කණ්ණමුණ්ඩය, රථකාරය, ඡද්දන්තය; කුණාලය, මන්දාකිණීය, සිංහප්‍රතාපය යනුයි.

දිරියොබයෝද=ශක්තිමත් යුධභටයෝද.

**187 වන පිට.** (163)

ඉටා=අධිෂ්ඨාන කොට; කෙසගක්=කෙස්අගක්.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution

# ශුද්ධි පත්‍රය.

| පිට. | පේළි. | වරද. | | නිවරද. |
|---|---|---|---|---|
| 2 | 1 | නවවගීයෙන් | ... | නවවග්ගියෙක් |
| 3 | 34 | කප්රුක්පසෙකි | ... | කප්රුක්සතෙකි |
| 10 | 12 | නිර්වාණය | .. | නිර්වාපණය |
| 11 | 12 | පරසතු, පාරිජාත | ... | පරසතු=පාරිජාත |
| ... | 24 | බ්‍රාහ්ම | ... | බ්‍රාහ්මණ |
| 13 | 28 | ධෘත | ... | ධෘතරාෂ්ට්‍ර |
| 34 | 2 | දියඋල්ලක්සේ | ... | දියඋල්ලක් |
| 36 | 35 | ධර්මාවය | ... | ධර්මාවයව |
| 45 | 14 | අලෙපසනොතාෂ | ... | අලෙපච්ඡසනොතාෂ |

25 වන පිටේ 1 නි පේළේ යොදා තිබෙන පෝරිසාදයන් නම අර්ථවශයෙන් සුතසෝම බෝධිසත්වයෝ යනු යොදා ගත යුතුයි.

ඉඳිහැර=කඩුළුඇර.

### 133 වන පිට.

දෙමළවාසල බිඳීම=දෙමළුන්ගේ දොර කැඩීම, වාසල් යනු දෙමළෙන් භින්නවූ ශබ්දයකි.

දොරබාව=දොරබෑය, දොරලෑල්ල.

### 134 වන පිට. (117)

ගැල්සකස්=කරත්ත රෝදයක්. ගැලත්තක්=රථකූඩුවක්.

රත්ප්‍රසාදී=රත්ත්‍යගදී, රත්රන් තෑගිකොටදී.

### 135 වන පිට. (118)

ධවලච්ඡත්‍ර=(ධවල+ඡත්‍ර) සුදුකුඩය, සේසත.

කිහිරිහරින්=ඛදිරභරයෙන්, කිහිරිඅරටුවෙන්.

### 136 වන පිට. (119)

ලේමොහොලගෙන=ලේකඳක්වී, ලේ ධාරාවක්වී.

ළෙන් ඇණී=පපුවෙන් ඇණිලා.

එකාතපත්‍රකොට=(එක+ආතපත්‍රකොට) එක්සත්කොට. ආතපත්‍රය යනු කුඩයයි හෙවත් අව්වට අල්ලන පත්‍රයයි.

### 137 වන පිට. (120)

පඩව්නැගී=කුඩා නැව්වලට නැගී, සුළුප්පුවලට නැගී.

මාවටුතොටට= මාන්තෝට්ටමට, මන්නාරම් වරාය අසල පිහිටි තොටක්.

පඩවිටිබැඳ=කඳවුරු බැඳ, සේනාව නවතාගෙන.

පඤ්චායුධ=(පඤ්ච+ආයුධ) පෙර රජදරුවන් සටන් පිණිස ගෙනගිය දුනු, මුගුරු, පත්කොහොල්, පාරාවළලු, අඩයටි යන යුධා යුධ.

ලාරසය=ලාකඩදිය; පශ්චිමාසනයෙහි=පසුඅසුනෙහි.

විත්තා=විත්තනයකොට, විනිවිඳයව.

### 138 වන පිට.

හීපගළියවසා=ඊතලයේ මූල වසා, පගිලිය යනු මූල පැතලි කොටසයි.

(121)

ඒකරාජයවූව=අනිකෙක් හිමි නැතිරාජ්‍යයක්විය.

විදශීනවඩා=අනිත්‍යය, දුක්ඛය අනාත්මය යන ත්‍රිවිධ භාවනා වඩලා.

අටළොස්කලනෑයක්=දහඅට කලඳක්; දහඅට අක්ෂෞහිණී යක්. විශාල සමූහයකටද කලඳයයි කියත්.

### 139 වන පිට.

කෘතාධිකාර=(කෘතී+අධිකාර) සම්පාදනය කළ ප්‍රඥාඇති.

## 147 වන පිට.

වායව්‍යකොණ්ණයෙහි=වයඹකොනෙහි.

වඩුමෙන්=වඩුවන්ගේ මිම්මෙන්.

කඳුරුළියහස=කන්දෙන් ගලාවැටෙන දියඇළ අසල.

**ධූපසාධන කථා නිමි.**

---

තලවිව=සමතලාව, ගෙපෙළ.

කඹුරුකුලින්= කඹුරාගේ කුළුගෙඩියෙන්, ආචාරියාගේ කුළු ගෙඩියෙන්.

සොම්මරුන්=සම්කරුවන්; සසංජාතහැල්=එනම් වී වර්ගය.

## 148 වන පිට.

ගඩුළු=(ගඩ+උළු) ගඩොල්. [කියත්.

කුරුඳුපහන්=කුරුවින්දපාෂාණය, පද්මරාග මාණික්‍යයයිද

සඳලිකැට=සබොරකැට; ගිවුල්ලාටුයෙන්=ජිවුල් මැලියමෙන්.

උතුරුසළුනැකත=උත්තරාෂාඪ නක්ෂත්‍රය.

එළුසිඳතු=හෙළඅබ, පොතුඇරිය අබ.

## 149 වන පිට.

ශර්කරා=හකුරුවර්ග; කසපැන් කුරුම්බා.

අෂ්ටවිධපානවර්ග=අටආකාර බීමවර්ග, එනම්:- මී, මුද්දරප්පලම්, උපුල්අල, ඇටිකෙහෙල්, මස්කෙහෙල්, අඹ, ජම්බු, බොරලු දමතු යන අටෙන් සාදාගත් බීම.

ලමග=කුරුඳු; තකුල්,=තුවරලා; පාලග=එන්සාල්.

පස්පලවත=පස්පලවෘත්තිය, කපුරු, කුරුඳු, තකුල්, එන්සාල්, සිඟුරු නොහොත් සාදික්කා, තකුල්, එන්සාල්, අරළු, පුවක් යන පස්වග.

(130)

අෂ්ටාදශ ශිල්පයෙහි=දසඅට ශිල්පයෙහි. ඔව්හු නම්:- ශික්ෂා, ව්‍යාකරණ, නිරුක්ති, ඡන්දස්, ජ්‍යොතිශ්ශාස්ත්‍ර, සතරවේදය, මීමාංස, න්‍යාය, ධර්මශාස්ත්‍රය, පුරාණ, ආයුර්වේද, ධනුර්වේද, ගන්ධර්වශාස්ත්‍රය, හා අර්ථශාස්ත්‍රයය.

## 150 වන පිට.

අටෝරා දහසකි=එකසිය අටදහසක්.

වින්ධ්‍යාටවත්තිනයෙන්=වින්ධ්‍යාවනය සමීප රටින්.

## 152 වන පිට. (131)

රත්තිලයෙහි=රත්රන් නගුලියේ.

මෝපක්ෂ=මවුපක්ෂ, උකාරයත් වකාරයාගේ ලොපය හා මකාරයාගේ මාත්‍රාවෘද්ධිය හා පිළිපෙරළියි.

කුලජවූ=කුලයෙහි උපන්, වංශවත්වූ.

පරිහරණය=රක්ෂාකිරීම, පාලනයකිරීම.

## 192 වන පිට.

පිල්කඩ=පිළු, පිල්කණ්ඩිය.

(141)

විසිනියද=නියපොත විස්සද.

ජාතිස්ඵටිකමාණික්‍යයෙන්ම=හොඳ පළිඟු මැණිකෙන්ම.

කෘෂ්ණමලණ්ඩද-කළු ලපයද, කළුඉඟිරියාවද.

ඌර්ණරොම=බැමදෙක අතර පිහිටි රෝම.

ත්‍රිශූලමුද්ගරාදි-ඊශ්වරයාගේ උල්තුනක් ඇති වේලායුධය හා මුද්ගරනම් ආයුධය ආදි.

බොධිපර්‍යඞ්කය-බොධිමූලයෙහි බුදුරජාණන්වහන්සේ වැඩිවූ වජ්‍රාසනය.

දළුම්විලවා=ඇත්දත් මිටිදමවා.

වීජනිපත්‍ර=වටාපත්, චාමරයෙන් සැදූ අවන්පත්.

## 163 වන පිට.

හඳුවගීයෙහි=උත්තම වගීයෙහි.

තුන්බෑජටිලයන්=සහොදර ජටිලයන් තිදෙන.

(142)

ලට්ඨිවන=ලාටරට වනය. [අඳුන.

පඬුඇඹුල්අඳුන්= පාණ්ඩුකාමලාසනය, ශත්‍රුයාගේ පඬුපුල්

දෙවොරොහණ=දෙව්ලොව නගින ගිණ, බුදුන් දෙවියන්ට අභිධර්මය දෙසන පිණිස දෙව්ලොව වඩිනකල දෙවියන් මැවූ හිණිමග.

## 164 වන පිට.

ආයුසංස්කාරය=ආයුබන්ධනය, ආයුෂ වැඩිම.

සූකරමද්දවය=සූකරමසින්සෑදූහොද්ද, ඌරුමස් ව්‍යඤ්ජනය.

ගණදෙටු=ජ්‍යෙෂ්ඨ සඞ්ඝයාවරු, පැවිදි නායකවරු.

(143)

හුදුසත්රුවනින්=අමිශ්‍ර සත්රුවනින්, රන් රිදී මුතු මැණික් වෛරොඩි පුෂ්පරාග වජ්‍රාස සත්රුවන් නවි.

සඳමහරජ්ජුරුවන්=මැද මහනුවර මහරජු; මද්‍රිදෙවියගේ පියා; පුසතීදෙවි=මද්‍රිදෙවිගේ මවු.

මද්‍රිදෙවි=විශ්වන්තර රාජයාගේ බිසව්.

ජාලියකෘෂ්ණා=ඔවුන්ගේ පුත්කුමරුවෝ.

සත්තසතකමහාදානය= එකවගීයෙන් සත්සිය බැගින් දුන් මහාදාන කෘතිය.

ඇවිරිගෙන=බලවත්ලෙස ඇලීගෙන.

## 165 වන පිට.

පිපීට=පාදවල පිටිපතුල; සළු පෙරළා,=ඇඳුම් වෙනස්කොට.

ගහටයෙන්ගැටකමින්, කූටතාවෙන්.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



ඉන්ද්‍රශාලා ගුහායෙහි=ශක්‍රශාලා නම් ගල්ලෙනෙහි.

**173 වන පිට.**

අටද්‍රෝණයක්=අටතිඹක්.

**175 වන පිට.** (152)

සරූප=ප්‍රවෘත්ති; විභවානුරූප=ධනවත්කමඅනුව.

**176 වන පිට.**

ඕලම්බක=අවලම්බිත, එල්ලෙන.

අටලොස්වර්ගයේ පානවර්ග=මී, උක්, මිදි, කෙසෙල්, ආදියෙන් තනාගත් දහඅට වර්ගයක බීම.

**177 වන පිට.** (153)

රථරොදයේ නිම් වළල්ලෙහි=කරත්තරොදයෙහි පට්ටමෙහි.

දියකාවකු=දියකොස්සකු දියකාවුඩකු.

**178 වන පිට.** (154)

අත්මැඩපියා=අත්මැඩලා, බලය යටත් කරලා.

**179 වන පිට.**

සඳකඩපහණැ=චන්ද්‍රඛණ්ඩක පාෂාණයෙහි; එනම් ගලෙහි.

ආමිසය=ආහාර පානාදිය, කෑයුතුදෙය.

ධර්මාභිෂෙකයක්=(ධර්ම+අභිෂෙකයක්) ධර්ම නායක බවට පත් කිරීමක්.

**180 වන පිට.** (156)

ළයවහල්කොටගෙන=පපුව වසාගෙන.

(157)

ගඳැළිවීද=රොගකරවීද, රුදැහටගන්නා සවභාවීද.

කර්පූරසලාවන්වීද=කපූරු සිළුමෙන්වීද.

**181 වන පිට.**

අනුග්‍රහකොට=කරුණාකොට, දයාකොට.

**182 වන පිට.**

කර්ණාමෘත කරමින්=කණට අමාවක්සේ මිහිරි කරමින්.

පැදකුණුකොට=ප්‍රදක්ෂිණකොට.

**183 වන පිට.** (159)

සමන්තභද්‍ර=සියලු ආකාරයෙන් උතුම්.

පරදුක්ඛ දුඃඛිත=අන්‍යයන්ගේ දුකට දුක්වෙන.

ධර්මගංගාප්‍රවාහ=ධර්මය නැමති ගලන ගංගා ජලය.

හෘදයානන්ද=හෘදයට සතුට උපදවන.

සරණාගත=සරණ සොයා පැමිණෙන්නන්ට.

වජ්‍රපඤ්ජර=වීදුරු කූඩුවක් බඳුවූ හෙවත් පිටුනොපාන්නාවූ.

## 188 වන පිට.

බුබ්බුලාකාරය=බුබුලක ආකාරය; සිවුරුස්=හතරැස්.
නොනිමෙනතුරුම=නිමවෙන්ට ප්‍රථම.
මරණසන්නව්‍යාධියෙන්=මරණයට ළංවූ රොගයෙන්.
ඉසහයා=ඉසඅල්ලාගෙන; කුළුපොත්තන්=පෙදරේරුවන්.
සැරගෙය=වැසුම්ගෙය, පිළිවලින් වසනාගෙය.

## 189–190 වන පිටු.

කිරිදිහෝ=කිරින්දේ ඔය.

සත්රුවන්=චක්‍ර, හස්ති, අශ්ව, මණි, ස්ත්‍රී, පරිනායක (ජ්‍යෙෂ්ඨ පුත්‍ර) ගෘහපති යන සත්රුවන.

මහාසම්මතරජු=මනුරජු, සූර්‍ය්‍යවංශයේ ප්‍රථම රජු, මරිචිහුගේ මුණුපුරුවූ රජු. එසින් කීහ :-

“විෂ්ණුනාභ්‍යබ්ජජො බ්‍රහ්මාමරිචි බ්‍රහ්මණඃ සුතඃ.”
මරිචෙඃ කාශ්‍යපස්තස්මාත් සූර්‍ය්‍යෙවෙස්වතො මනුඃ”

අසඞ්ඛ්‍යායුෂකා=ආයුෂ අසංඛ්‍යයක් ඇති.

දසබෑරජදරුවෝ=සහෝදර රජදරුවෝ දසදෙන. එනම්:- වාසුදෙව, බලදෙව, අර්ජුන, ප්‍රද්‍යුම්න, චන්ද්‍රදෙව, සූර්‍ය්‍යදෙව, ශූදෙව, අග්නිදෙව, ඍත, අංකුර යනුයි.

ස්වයම්භූඥනයෙන=තමාගේම නුවණින්.

## 191 වන පිට.

පින්කිරියවත්=කළපුණ්‍යක්‍රියා ලියනලද පොත.

පාත් පියලි=පාත්තිර; පුළුබ්බදනාබත්=අස්මී නම් කැවිලි වර්ගය.

## 193 වන පිට.

දෙය්‍යධර්මය=දියයුතු දහම, දියයුතු දැනවස්තු, දන්දෙන පිළිවෙත.

තණසාලේ පැසිබත=තණහාලෙන් පිසූබත.

## 195 වන පිට.

ඔපාතික දිව්‍යපුත්‍රව=මවුගර්භයක නොඉපිද වන දිව්‍ය බ්‍රහ්මාදීන් උපදින ක්‍රමය.

ඉසකේවැටි=කොණ්ඩය, ඉසකේ බැඳිම.
මකුට=ඔටුන්න; විරවිතු=වෙන්වීම.

## 196 වන පිට. (170)

දකුණත්සව්වන්=අග්‍රශ්‍රාවකයන්; වමත්සව්=උපශ්‍රාවක.

— නිමි. —